

2021

Ampara Town

වාර්ෂික කාර්යය සාධන වාර්තාව හා ගිණුම්

வருடாந்த செயலாற்று அறிக்கையும் கணக்கறிக்கையும்

Annual Performance Reports & Accounts



දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අම්පාර.

மாவட்ட செயலகம் - அம்பாறை.

District Secretariat - Ampara.

දිසාපතිතුමාගේ පණිවුඩය



2021 වර්ෂයේ අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඉටු කරනු ලැබූ සේවාවන් හා සිදු කරනු ලද ව්‍යාපෘතීන් කේන්ද්‍ර කොට ගනිමින්, වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරන්නේ සතුටින් සහ තෘප්තියෙනි. 2002.09.12 දිනැති අංක 402 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයට අනුව, අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හී මූල්‍ය පාලනය පාදක කර ගනිමින් මෙම වාර්තාව පිළියෙල කර ඇත.

ගල්ඔය ගංගානිම්නයේ ජනපදකරණයට යටත් වූ පැරණි දිගාමඩුලු ජනපදයට අයත් වූ වර්තමාන අම්පාර දිස්ත්‍රික්කය ශ්‍රී ලංකාවේ නැගෙනහිර පළාතේ ස්ථානගතව ඇත. කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ජාතික නිෂ්පාදනයේ විශාල පංගුවකට හිමිකම් කියන අම්පාර දිස්ත්‍රික්කය සාර්ථක කරදිය සහ මිරිදිය මත්ස්‍ය කර්මාන්තයෙන් ද රටෙහි පෝෂණ අවශ්‍යතා සපුරා ලීමට දායක වේ. විශ්ව විද්‍යාලයක්, උසස් තාක්ෂණ ආයතනයක්, අධ්‍යාපන විද්‍යා පීඨයක්, තාක්ෂණික පාසල, වෘත්තීය පුහුණු ආයතන මෙන්ම ජාතික පාසැල් ඇතුළු දියුණු කාර්මික පුහුණු ආයතන හා පාසල් පද්ධතියකින් සන්නද්ධව අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉහළ ගුණාත්මක වර්ධනයක් ඇති කර ගැනීමට අම්පාර දිස්ත්‍රික්කය සමත් වී ඇත.

පාරිසරික වශයෙන් ආකර්ශනීය වූ ගල්ඔය ජාතික වනෝද්‍යානය, ආරුගම්බේ සර්ෆින් මුහුදු තීරය මෙන්ම, සංස්කෘතිකමය වශයෙන් වැදගත් වූ රජගල, දීඝවාපිය, මඟුල් මහා විහාරය, බුද්ධංගල, ඔකඳ දේවාලය, කඩක්කරෙ පල්ලිය යනාදියෙන් ද සමන්විත වීම නිසා දෙස් විදෙස් සංචාරකයන්ගේ පාරාදීසයක් බවට පත්වී ඇත.

විකසිත ප්‍රජාවකින් හෙබි ඉසුරු පිරි දිස්ත්‍රික්කයක් ලෙස ගොඩනැඟෙමින් පවතින අම්පාර දිස්ත්‍රික්කයට අතිගරු ජනාධිපතිතුමන්ගේ මඟ පෙන්වීම යටතේ ක්‍රියාත්මක වන ජාතික වැඩසටහන්, විශේෂයෙන්ම හරිත කෘෂි කර්මාන්තයෙන් පරිපූර්ණ වූ තිරසර ගොවිතැනින් සුරක්ෂිත ආහාර දැයට දායාද කිරීම අරමුණු කොට ගත් මේ ව්‍යාපෘතිය දිස්ත්‍රික්කයේ හෙට දවස වෙනුවෙන් සිදුවන මහඟු ආයෝජනයක් වනු ඇත.

කෘෂි ආර්ථිකය ජීවනාලිය කරගත් දිගාමඩුලු ගොවි ජනතාව ආර්ථික වශයෙන් සවි බල ගන්වමින්, පවත්නා ගොවිපල පද්ධතිය තිරසර, හරිත ගොවි පද්ධතියක් බවට කළමනාකරණය කරමින්, යෝග්‍ය තාක්ෂණය උපරිම කාර්යක්ෂමතාවයෙන් භාවිත කර ප්‍රශස්ත ඵලදායීතාවයක් ලබා ගනිමින් දිගාමඩුලු ආහාර සුරක්ෂිතතාවය තහවුරු කරමින් ජාතික ආර්ථිකයේ ප්‍රමුඛතම ආහාර නිෂ්පාදකයා වෙමින්, විදේශීය වෙළඳපොල කෘෂි නිෂ්පාදන ඔස්සේ ජය ගනිමින්, ගොවි ජනතාවගේ ජීවන තත්වය ඉහළ නැංවීම අපගේ මුඛ්‍ය පරමාර්ථය යි. එකී සුවහසක් ජනයාගේ ජීවිත විකසිත කරමින් ඉසුරු පිරි හෙට දිනයක් උදා කරනු වස් අදාල චක්‍රෙල්ඛ, අන පනත්, නීති රීති, රෙගුලාසි වලට අනුගත වෙමින්, එහෙත් හැකි උපරිමයෙන් ජනතාවගේ අභිවෘද්ධිය උදෙසා හැකි උපරිම ධාරිතාවය යොදවමින්, පළාතේ දේශපාලන අධිකාරියේ උපදෙස් සහ මඟපෙන්වීම යටතේ රාජ්‍ය ප්‍රතිපත්තීන් කාර්යක්ෂමව ක්‍රියාවට නැංවීමේ අති භාර දූර වගකීම අපගේ උර මත පැටවී ඇත. මෙකී වගකීම ඉටු කිරීමේදී, මෙම කාර්ය සාධන වාර්තාවේ සඳහන් අරමුණු සහ ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය අනුශාෂ්‍යකත්වය ලබාදුන් සර්ව ආගමික නායකත්වය ද සහයෝගය ලබාදුන් දේශපාලන අධිකාරිය ද එයට අමතරව මෙම කර්තව්‍යයන් උදෙසා සෘජු හෝ වක්‍රව අප හා සම්බන්ධ වූ අම්පාර දිස්ත්‍රික්කයේ අනෙකුත් රාජ්‍ය, අර්ධ රාජ්‍ය, රාජ්‍ය නොවන සංවිධාන වල ප්‍රධානීන් සහ කාර්ය මණ්ඩල සිවිල් සමාජ සංවිධාන, ග්‍රාමීය කමිටු යනාදිය ද ඉතා කෘතඥ පූර්වකව සිහිපත් කරමි.

මෙකී කාර්ය භාරය තුල, ඉහල කාර්ය සාධනයකින් යුතුව මෙම වාර්තාවේ සඳහන් ඉලක්ක කරා ළඟා වීම සඳහා ඉතා ප්‍රමුඛ කාර්ය භාරයක් ඉටු කළ පිරිස වූයේ ප්‍රාදේශීය ලේකම් වරුන්ය. ප්‍රාදේශීය ලේකම් කාර්යාල පද්ධතිය අතර සමායෝජනය හා කළමනාකරණය කරමින්, පසුගිය වසරේ දී අපගේ ඉලක්ක සපුරා ගැනීමට උපරිම දායකත්වය සැපයූ අතිරේක දිස්ත්‍රික් ලේකම්වරු, ප්‍රධාන ගණකාධිකාරී, අධ්‍යක්ෂ (සැළසුම්) හා අනෙකුත් අධ්‍යක්ෂවරු, දිස්ත්‍රික් ඉංජිනේරු සහ සියලුම කාර්ය මණ්ඩලයට ත් දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම්වරුන් ප්‍රධාන එම කාර්යාල වල මාණ්ඩලික නිලධාරීන් ඇතුළු සමස්ථ කාර්ය මණ්ඩලයට ත් මාගේ ප්‍රශංසාව පිරිනමමි.

එසේම, Covid වෛරසය පැතිර යමින් නිබෙන කාල වකවානුවක, තම සේවා අවශ්‍යතාවය පිළිබඳව අවධානය යොමු කරමින් තම සේවා කටයුතු එම නිලධාරීන් විසින් ඉටු කිරීම පිළිබඳව මාගේ ප්‍රශංසාව එල කරමි.

ජේ.එම්.ඒ.ඩග්ලස්,
දිසාපති/ දිස්ත්‍රික් ලේකම්,
අම්පාර දිස්ත්‍රික්කය.

Contents

01. පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය 1

1.1 හැඳින්වීම 1

විකසිත ප්‍රජාවකින් හෙබි ඉසුරුපිරි දිස්ත්‍රික්කයක් - අම්පාර දිස්ත්‍රික්කය 1

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු 4

1.3 ප්‍රධාන කාර්යයන් 5

1.4 සංවිධාන සටහන - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අම්පාර 6

1.5 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා අනුබද්ධිත ආයතන 7

1.6 අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුව/පළාත් සභාව යටතේ පවතින ආයතන 8

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (තිබේ නම්) 8

02. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම 9

03 පරිච්ඡේදය - 20**21 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ථ මූල්‍ය කාර්ය සාධනය** 12

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය 12

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 13

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය 14

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන් 15

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය 26

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය 27

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන 28

3.8 **මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය** 31

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව 32

04. පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක 44

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) 44

05. පරිච්ඡේදය - තිරසාර සංවර්ධන ඉලක්ක (SDG) සාක්ෂාත් කර ගැනීම. 45

5.1 හඳුනාගත් අදාළ තිරසාර සංවර්ධන ඉලක්ක දක්වන්න 45

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න. 47

06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ 48

06.1 සේවක සංඛ්‍යා කළමනාකරණය 48

06.2 **ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපෑම 48

06.3 මානව සම්පත් සංවර්ධනය 49

07. පරිච්ඡේදය – අනුකූලතා වාර්තාව 50

01. **පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය**

1.1 හැඳින්වීම

<u>විකසිත ප්‍රජාවකින් හෙබි ඉසුරුපිරි දිස්ත්‍රික්කයක් - අම්පාර දිස්ත්‍රික්කය</u>

පැරණි දිගාමඩුලු ජනපදයට අයත් වූ වර්තමාන අම්පාර දිස්ත්‍රික්කය ශ්‍රී ලංකාවේ නැගෙනහිර පළාතේ ස්ථානගතව ඇත. මෙහි භූමිය තැනින් තැන පිහිටි ශේෂ කඳුවලින් යුක්ත තැනිතලාවකි. මේ තැනිතලාව මුහුදු මට්ටමේ සිට සාමාන්‍යයෙන් අඩි 200 දක්වා ද හෙල් මුදුන්වල අඩි දහස දක්වා ද උස්ව පිහිටියේය. මේ සැබවින්ම සියල් සරින් පිරි බිම් කඩෙකි. ඈත ඌවේ කඳුකරය පශ්චාත් භාග කොට ගත් අඳුරු වන තීරයෙන් ආරම්භ වී මෑත වෙරළ තීරය තෙක්ම එක එල්ලේ විහිදී ගිය මනහර වෙල්යායෙකි. එය පෙර රජ දවස දකුණු දිග වෙරළ තීරය දක්වාම පැතිර පැවතියෙකි. මේ පෙදෙසේ සිත්කළු දර්ශනය සෘතුවෙන් සෘතුව වෙනස් වෙස් ගෙන බැබළෙනි. වැසි කලට නිබඳ දියෙන් පිරීගත් කලපුවක සිරි ගන්නේය. ඊසාන මෝසම දුර්වන වෙද්දී පළාවන් ගොයමින් වැසි හරිත සමුද්‍රයක ශෝභාව පාන්නේය. ගොයම වැඩෙද්දී සිංහල ,දෙමළ හා මුස්ලිම් ගොවි දනන්ගේ පැල් වෙල් යායේ තැනින් තැන පැන නැඟ එයි. කුඹුර පැසෙද්දී ඈත වන තීරයෙන් එළි බැස එන අලින්, ඌරන්, මොණරුන් වැනි වන සතුන් මතු වෙයි. නැවත අස්වනු අස් කොට ගත් පසු මේ භූමිය එළ, මී, ගවයින් සිය ගණනින් සැදී රංචු සැරිසරන සුන්දර දර්ශනයක් මවයි. වියළි අගෝස්තුව වන විට දීප්ත සූර්ය රශ්මියෙන් පොළව දා ගිය කල සතෙකුට තණපතක් දිය බිදක් නැති කර්කශ, වේගවත් මාරුතයෙන් උඩ නැගී කැරකෙන දූවිල්ලෙන් වැසුණු බිමක් බවට පෙරළේ.

මඩකලපුව දිසාපතිවරයා යටතේ රටේ මහත්තුරුන් විසින් පරිපාලන රාජකාරි සිදු කරන ලද මෙම බිම් කඩෙහි 1924 දී වැව්ගම්පත්තුව නමින් නව පරිපාලන ඒකකයක් ස්ථාපිත විය. වෑත්තෑවේ රටේ මහත්තයා එහි පළමු රටේ මහත්තයා වූ අතර, පැරණි වාරිමාර්ග නැවත පිළිසකර කිරීමේ කටයුතු වේගවත්ව එම කාලය තුළ දී සිදුව ඇත. එලෙස ඇරඹි සංවර්ධනයේ කූඨප්‍රාප්තිය සනිටුහන් කරමින් ඩී.එස්.සේනානායක ශ්‍රීමතාණන්ගේ මෙහයවීමෙන් ගල්ඔය සංවර්ධන ව්‍යාපාරය දියත් විය. එම ගොවි ජනපද ව්‍යාපාරයේ අනගිතම නිමවුම අම්පාර දිස්ත්‍රික්කයයි. වැව්ගම්පත්තුව, බින්තැන්නපත්තුව, පානම්පත්තුව, සම්මන්තුරේපත්තුව, නින්දවූර්පත්තුව, අක්කරපත්තුව ඇතුළු පැරණි පරිපාලන ඒකක එකතු කර 1961 වර්ෂයේදී අම්පාර නමින් වෙනම පරිපාලන දිස්ත්‍රික්කයක් ස්ථාපිත විය. 1961 අප්‍රේල් 10 දින ජේ.ඩී.එස්.ඩී ලියනගේ මහතා මෙහි පළමු දිසාපතිවරයා ලෙස පරිපාලන රාජකාරී ඇරඹීය. 80 දශකයේදී මහවැලි සංවර්ධන ව්‍යාපාරය යටතේ මහවැලි සී කලාපය හෙවත් දෙහිඅත්තකණ්ඩිය ප්‍රදේශය ද මෙම දිස්ත්‍රික්කයට එක් විය. වර්තමාන අම්පාර දිස්ත්‍රික්කය සම්මන්තුර ,කල්මුණ, පොතුවිල්, අම්පාර යන ඡන්ද ප්‍රදේශ 04 ක්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 20ක්, ග්‍රාම නිලධාරී වසම් 503 ක් හා ගම්මාන 614 කින් සමන්විතය. ඒ අතර, මහනගර සභා 02 ක් නගර සභා 01 ක් ප්‍රාදේශීය සභා 17 ක් හා පොලිස් ස්ථාන 14 ක් පවතී. කිලෝමීටර් 115 ක් පුරා දිවෙන දර්ශනීය වෙරළ තීරය ද, තැනින් තැන පිහිටි ශේෂ කඳු ද, ගමින් ගම පිහිටි නිල්දිය පිරි මහ වැව් ද, ඒ වැව් ඔස්සේ පීදෙන හරිත වෙල් යාය ද, වන සතුන් නිදහසේ සරනා වන ගොමු ද, මෙම දිස්ත්‍රික්කයේ සුන්දරත්වය සේම වටිනාකම ද ඉහළ නංවයි. දිස්ත්‍රික්කයේ බහු ආගමික, බහු සංස්කෘතික උරුමයන් විදහා දක්වමින් විහාරස්ථාන 223 ක් ද, හින්දු කෝවිල් 203 ක් ද, මුස්ලිම් පල්ලි 369 ක් හා ක්‍රිස්තියානි පල්ලි 74 ක් ද පවතී.

ජන සංඛ්‍යා ලේඛණ දත්තවලට අනුව (දිස්ත්‍රික් සංඛ්‍යා ලේඛණ 2019) පසුගිය වසර වන විට අම්පාර දිස්ත්‍රික්කයේ ජනගහනය සමස්ථ ජනගහනය 728,086 කි. පවුල් සංඛ්‍යාව 205,211 ක් වේ. මෙම සමස්ථ ජනගහනය තුළ 41.49% ක් මුස්ලිම් ජනතාව ද, 35.32% ක් සිංහල ජනතාව ද 22.581% ක් දෙමළ ජනතාවගෙන් හා 0.6% ක් අනෙකුත් ජනතාව ද නියෝජනය වන අතර, මෙම සියලු ජාතීන් සමගියෙන් හා සහජීවනයෙන් ජීවත් වෙති.

මෙම දිස්ත්‍රික්යේ වපසරිය වර්ග කිලෝමීටර් 4,415 ක් වේ.. මෙහි සමස්ථ වගා බිම් ප්‍රමාණය වර්ග කිලෝමීටර් 1,264.47 කි. අභ්‍යන්තර ජලාශ ලෙස වර්ග කිලෝමීටර් 328.03 ද වනාන්තර ප්‍රමාණය (Forest & Range Land) වර්ග කිලෝමීටර් 2,097.53 ක් ද වේ. මෙහි වාර්ෂික වර්ෂාපතනය මිලිමීටර් 1,886 ක් පමණ වන අතර, සාමාන්‍ය උෂ්ණත්වය සෙල්සියස් අංශක 29.81 ක මට්ටමේ පවතී.

දිවයිනේ විශාලතම ජලාශය වන සේනානායක සමුද්‍රය ආශ්‍රිත වාරිපද්ධතිය මඟින් පෝෂණය වෙමින් ශ්‍රී ලංකාවේ ජාතික වී නිෂ්පාදනයෙන් 22.5% ක් දැයට උරුම කරමින් කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ '' ජාතියේ වී බිස්ස" යන විරුදාවලිය ලත් අම්පාර දිස්ත්‍රික්කය උක් වගාව, අතිරේක බෝග වගාව, පශු සම්පත් සහ සාර්ථක කරදිය හා මිරිදිය ධීවර කර්මාන්තය තුළින් ජාතික ආහාර නිෂ්පාදනයේ ප්‍රමුඛස්ථානය හිමි කරගෙන ඇත.

විශ්ව විද්‍යාලයක්, උසස් තාක්ෂණ ආයතන, අධ්‍යාපන විද්‍යා පීඨයක්, තාක්ෂණික විද්‍යාල, වෘත්තීය පුහුණු ආයතන මෙන්ම ජාතික පාසල් ඇතුළු දියුණු පාසල් පද්ධතියකින් සන්නද්ධව අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉහළ ගුණාත්මක වර්ධනයක් ඇති කර ගැනීමට අම්පාර දිස්ත්‍රික්කය සමත් වී ඇත. ජාතික හා ජාත්‍යන්තර මට්ටමෙන් ඵලදායීතා සම්මානයන්ගෙන් පිදුම් ලත් සෞඛ්‍ය සේවයක් දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක වීම ගොවි ජනයා ප්‍රමුඛ ප්‍රදේශවාසීන්ට මහත් අස්වැසිල්ලක් වී ඇත.

පාරිසරික වශයෙන් ආකර්ෂණීය වූ ගල්ඔය ජාතික වනෝද්‍යානය, කුමන ජාතික කුරුලු උයන, ලාහුගල ජාතික වනෝද්‍යානය, ආරුගම්බේ සර්ෆින් මුහුදු තීරය මෙන්ම, සංස්කෘතිකමය වශයෙන් වැදගත් වූ රජගල, දීඝවාපිය, මගුල් මහා විහාරය, ඛුද්ධංගල, ඔකඳ දේවාලය , කඩක්කරෙ පල්ලිය යනාදියෙන් ද සමන්විත වීම නිසා දෙස් විදෙස් සංචාරයන්ගේ පාරාදීසයක් බවට පත්ව ඇත.

අම්පාර දිස්ත්‍රික්කයේ ඓතිහාසික පසුබිම

පුරාණ ලංකාව රුහුණු,මායා,පිහිටි යනුවෙන් රාජ්‍යයන් තුනක් වශයෙන් පැවතුණි.රුහුණු රාජධානියේ ඉතා වැදගත් දනව්වක් වශයෙන් සැලකූ දීඝවාපී හෙවත් දිගාමඩුලු රාජධානියේ ඉතිහාසය බුද්ධ කාලය දක්වා ඈතට යන බව ඓතිහාසික තොරතුරු වලින් සනාථ වෙයි. වංශ කථාවන්ට අනුව විජය ලංකාවට ගොඩබසින ලද්දේ බුදුරජාණන් වහන්සේගේ පිරිණිවන් පෑම සිදුවූ දිනයේය.මණිඅක්ඛිත නා රජුගේ ඇරයුමෙන් බුදුරජණන් වහන්සේගේ තුන්වන වරට ලක්දිවට වැඩම කරන ලද කල්‍යාණ ගමනේදී දීඝවාපියට වැඩම කරවීම ගැන සඳහන් වේ.

අම්පාර ප්‍රදේශය ආර්ය ජනාවාසයක් බවට පත්වී ඇත්තේ විජය රජුගෙන් පසු පාලකයා බවට පත්වූ පඬුවස් දෙව් රජුගේ අවධියේය. පඬුවස් දෙව් රජුගේ බිසව වන භද්දකච්චායනා කුමරිගේ සහෝදරයකු වූ දීඝායු කුමරු විසින් පිහිටුවන ලද දීඝායුගාම පසුව දීඝවාපී,දිගාවැව හා දිගාමඩුල්ල යන නම් වලින් හැඳින්වුන බව වංශ කථාවන්ට අනුව සඳහන් වී ඇත.

දීඝගාමිණීගේ පුත් පණ්ඩුකාභය කුමරු විසින් අනුරාධපුරය සිය අනසකට ගෙන අනුරාධපුරයෙහි අගනුවර පිහිටවනු ලැබීය.මෙතැන් සිට දිගාමඩුල්ල අනුරපුර මහ රජුගේ එක් ප්‍රාදේශීය පාලන කොට්ඨාශයක් වූ අතර, එය ප්‍රධාන ධාන්‍යාගාරය වේ.පොළොන්නරු රාජධානිය බිඳ වැටී පාලන අධිකාරිය නිරිත දිග ප්‍රදේශයට තල්ලු වීමත් සමඟ අම්පාර ප්‍රදේශය වල් බිහිවන්නට විය.

මහසෙන් රජුගේ මහා වාරි කර්මාන්ත ව්‍යාපාරය නැගෙනහිර බින්තැන්නේ සිට තමන්කඩුව හා සේරු නුවර ඔස්සේ නුවර කලාපය තෙක් පැතිරී ඇත. ස්වකීය සංවර්ධන කටයුතු වළදී රුහුණ අමතක නොකළහ. දීර්ඝ කාලයක් නිස්සේ වර්ධනය වූ වාරි කර්මාන්තයට නෂ්ඨාවශිෂ්ට අම්පාර ප්‍රදේශය තුළ සිසාරා ඇවිද යන විට දැකිය හැක.

ලංකාවේ ඉතිහාසය ශිලා ලේඛන ගත කිරීමට පෙර ගල්ඔය මිටියාවත වැදි ජනතාවගේ ගොදුරු බිමක්ව පැවති බව ආචාර්ය ආර්.එල්. බ්‍රෝහියර් මහතා සඳහන් කර ඇත. මුල් ආර්යන් විසින් පිහිටවුනු ක්‍රි.පූ.03 වන සියවස දක්වා දිවෙන සෙල්ලිපි වල දක්නට ඇත.

අම්පාර දිසාවේ ඉතිහාසය පිළිබඳව කථාකරන කළ, රජගල ප්‍රදේශය වටිනා ඓතිහාසික තොරතුරු රැසක් ලැබී ඇති ප්‍රදේශයකි.මෙහි දක්නට ලැබෙන චෛත්‍යයක නටඹුන් අසල පිහිටා ඇති සෙල් ලිපියක "යෙ ඉමදිය පටමය අගනන ඉධීක තෙර මහිද තෙර තුබෙ "යන වාක්‍ය කොටා ඇත.මේ අනුව එම චෛත්‍යය මෙම ද්වීපයේ අභිවෘද්ධිය සඳහා පැමිණි ඉට්ඨීය හා මහින්ද තෙරුන්ගේ දාගැබ ලෙස හඳුන්වා දී ඇත.මෙය මිහිදු හිමියන්ගේ ලංකා ගමන හා ඒ සමඟ පැමිණි ඉට්ඨීය හිමියන් පිළිබඳ මහා වංශ පුවත සනාථ කරන්නකි. මිහිදු හිමි පිරිනිවන් පෑ පසු දාතුන් නිදන් කර රටපුරා දාගැබ් ගොඩ නංවා ඇති බවට වන පුවතද සනාථ කරන්නකි.මේ අතරම රජගලින් ලැබී ඇති තවත් ලිපියක දුටුගැමුණු රජුගේ බිසවක්

සේ හදුන්වා ඇති රජිතා නම් කාන්තාව ගැන සඳහන් වේ. මෙය ඓතිහාසික වශයෙන් අතිශය වැදගත් ලිපියකි. එසේම නන්දිමිත්‍ර යෝධයාගේ හා දුටුගැමුණු රජුගේ පවුල් දෙක අතර විවාහ සබඳතාවක් පිළිබඳ සාධකයක් සපයන සෙල් ලිපියක්ද රජගලින් සොයාගෙන ඇත. මේ සෙල් ලිපිය හා අම්පාර දිස්ත්‍රික්කයේ බමුණුගල සෙල් ලිපියත් එකට සලකා බැලීමේදි දුටුගැමුණු රජුගේ දියණිය නන්දිමිත්‍රගේ පුතෙක් සමග විවාහ වී සිටි බවට සාක්ෂි සැපයේ.

දසවැනි සියවසට අයත් කොණ්ඩුවටුවාන් සෙල්ලිපිය සුවිශේෂී වැදගත් කමක් ඇති ඓතිහාසික මූලාශ්‍රයක් ලෙස විද්වත්තු පිළිගැනිති.එම සෙල්ලිපියට අනුව අනුරාධපුර යුගයේ අවසාන භාගය වන විටත් අම්පාර සශ්‍රීක සිංහල ජනාවාසයක් වූ බව පැහැදිලිව ඔප්පු කරයි. එකී ගම් ස්වයංපෝෂිත ගම්මාන බව " අලෙවිය සඳහා පිටතින් බඩු නොගෙන්විය යුතු බවට" කර ඇති නියෝගයන් ඇත. එසේම මෙම ප්‍රදේශය අනුරාධපුර රාජධානියට අයත්ව පාලනය වූ බවට තොරතුරු මෙකී සෙල් ලිපියෙන් ප්‍රකාශ වේ.

පොළොන්නරු යුගයේදී අම්පාර වැදගත් තැනක් හිමිකරගත් බවට සාක්ෂි ඉතිහාසයෙන් ලැබේ. සොලී ආධිපත්‍යයෙන් රට මුදාගෙන රට එක්සත් කිරීම සඳහා ගෙන ගිය මහා විජයබාහු (1055-1110) රජුගේ විමුක්ති ව්‍යාපාරයට ද දිගාමඩුල්ල උපකාරී වූ බවට තොරතුරු ඇත.එතුමා දිගාමඩුල්ලේදී කළ සටන් කිහිපයක් ගැන සඳහන් වේ.සුගලා රැජිනගේ ආධිපත්‍යයට දිගාමඩුල්ල අවනතව තිබූ බවට තොරතුරු ලැබිණි.මහා පරාක්‍රමබාහු (1153- 1186) රජතුමා දන්ත දාතූන් වහන්සේ ලබාගැනීම සඳහා සුගලා රැජිණ සමග යුද්ධ කරන ලද්දේ දීඝවාපියේදී බව ලංකා විශ්ව විද්‍යාලයේ ලංකා ඉතිහාසයේ ග්‍රන්ථයේ සඳහන් වෙයි. මෙයින් පැහැදිලි වන වැදගත් කරුණ වන්නේ ලංකා ඉතිහාසයේ එක් අවධියක දළදා වහන්සේගේ අයිතිය දීඝවාපියට හිමිව තිබූ බවය.කීර්ති ශ්‍රී රාජසිංහ රජු 1756 වර්ෂයේදී දීඝවාපියට පැමිණ දීඝවාපී දාගැබ ප්‍රතිසංස්කරණය කරවා එම විහාරස්ථානය බන්ඩිගොඩේ නීග්‍රෝධ නායක හිමියන්ට පූජාකළ බවට දීඝවාපී සන්නසේ සඳහන් වේ. මේ පුවත වංශ කථා පුවත් වලින් ද සනාථ වන අතර, දීඝවාපි චෛත්‍යයේ බටහිර වාහල්කඩේ මෑතක් වනතුරු දැකගන්නට තිබූ දුර්වර්ණ වී ගිය චිත්‍ර සටහන් නුවර යුගයට අයත් චිත්‍ර සම්ප්‍රදායට අයත් බව පෙනී ගොස් තිබුණි.

1818 න් පසුව අම්පාර ප්‍රදේශයේ සිදු වූ වැදගත් සිදුවීමක් ලෙස පෙන්වා දිය හැක්කේ වාරි කර්මාන්ත සංවර්ධනයේ ලා බ්‍රිතාන්‍යයන් දැක්වූ දායකත්වයයි. විශේෂයෙන්ම 1853 දී සර් හෙන්රි වෝඩ් ආණ්ඩුකාරවරයා නැගෙනහිර පළාතේ අම්පාර ප්‍රදේශයට පැමිණ මේ ප්‍රදේශයේ වාරි කර්මාන්ත සංවර්ධනය සඳහා මුදල් යෙදවීමේ වැදගත්කම පිළිබඳ අවබෝධ කර ගැනීම වාරිකර්මාන්ත පුනරුත්ථාපනය සඳහා එවක බ්‍රිතාන්‍ය රජයේ මුදල් යෙදවීම ආයෝජනය කිරීමක් සඳහා හේතු විය. මේ යටතේ අම්පාර දිස්ත්‍රික්කයට අයත් දිවුලාන, දඩයන්තලාව, සාගම වැනි ජලාශ පුනරුත්ථාපනය කිරීමත්, 1880 දශකයේදී පට්ටිපොල ආරු ව්‍යාපාරයේ ආරම්භ කිරීමත් සුවිශේෂී සිදුවීමක් විය.පට්ටිපොල ආරු යෝජනා ක්‍රමය යටතේ අම්පාර වැව, කොන්ඩුවටුවාන වැව, එරගම වැව ආදී ජලාශද ගල්ඔය දිගට, අමුණු රැසක්ද ඉදිකර අක්කර 40000 කට ආසන්න ප්‍රමාණයකට වගාවන් සඳහා ජලය ලබාදීමත් සමඟ දිවයිනේ විශාලතම කුඹුරු යාය අම්පාර ප්‍රදේශයෙන් ඉදි කෙරුණි.

ඉන්පසුව 1930 දශකය වන විට ගල්ඔය වාරිමාර්ග යෝජනා ක්‍රමය පිළිබඳ මූලික අදහස වාරිමාර්ග අධ්‍යක්ෂ කෙනඩි විසින් ඉදිරිපත් කිරීමත් සමඟ නැගෙනහිර පළාතේ අම්පාර ප්‍රදේශය නැවත වරක් සංවර්ධනයේ කේන්ද්‍රස්ථානයක් බවට පත්විය. විශේෂයෙන්ම ශ්‍රී ලාංකීය වාරි කර්මාන්ත ඉතිහාසයේ නව පරිච්ඡේදයක් අරඹමින් උස්බිම් ආශ්‍රිත ගැඹුරු ජලාශ ඉදිකර වාරිමාර්ග සඳහා ජලය සැපයීමේ ක්‍රමවේදය යෝජනා කරනු ලැබුවේ ගල්ඔය වාරිමාර්ග සංවර්ධන සැලැස්ම මඟිනි.

ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය පාලනයට නව අත්තිවාරමක් පිහිටුවීමට ආධාර වූ කෝල්බෘක් කැමරන් යෝජනා අනුව 1833 දී දිවයින පලාත් පහකට බෙදන ලදී. එහිදී අම්පාර ප්‍රදේශය නැගෙනහිර පළාතට අයත් විය. නැගෙනහිර පළාත ත්‍රීකුණාමලය සහ මඩකලපුව දිස්ත්‍රික්ක වලින්ද තමන්කඩුව සහ බින්තැන්න ප්‍රදේශ වලින්ද සමන්විත විය. මෙසේ පිහිට වූ පළාත් නැවත දිස්ත්‍රික්ක වලට බෙදුණි. ඒ අනුව නැගෙනහිර පළාත ත්‍රීකුණාමලය සහ මඩකලපුව යන දිස්ත්‍රික්ක වලින් යුක්ත විය. මඩකලපුව දිස්ත්‍රික්කයට දිගාමඩුල්ල සහ බින්තැන්න ඇතුළත් වේ. 1837 දී බින්තැන්න බදුල්ල දිස්ත්‍රික්කයට යා කරන ලදී. මෙතැන් සිට 1961 දී අම්පාර දිස්ත්‍රික්කය පිහිටුවන තුරු දිගාමඩුල්ල ප්‍රදේශය පාලන බෙදීම් වලට පාත්‍ර නොවිණි.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

<u>අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය දැක්ම, මෙහෙවර</u>

<u>ප්‍රකාශය හා අගයන්</u>

දැක්ම

විකසිත ප්‍රජාවකින් හෙබි ඉසුරුපිරි දිස්ත්‍රික්කයක්.

මෙහෙවර

දිස්ත්‍රික්කයේ සම්පත් ප්‍රශස්ත ලෙස යහපාලනමය යාන්ත්‍රණය ඔස්සේ කළමනාකරණය කර නිරසර සංවර්ධනය කරා මෙහෙයවමින් නිදහස් හා සුරක්ෂිත හෘදයාංගම පරිසරයක දැනුමෙන්, නිපුණත්වයෙන්, නිර්මාණශීලීත්වයෙන් හා නිරෝගී බවින් සපිරුණු ඉහළ ජීවන තත්ත්වයෙන් හෙබි, ජනතාවක් සහිත ඉසුරුපිරි දිස්ත්‍රික්කයක් හොඩ නැඟීම.

අපේ අගයන්

- හෘදය සංවේදී රාජ්‍ය සේවක කැළක්.
- සොයා එන හැම දන මන විකසිත වන විශ්වසනීය සේවයක්.
- නව්‍යත්වය සොයමින් සැනෙකින් විසඳුම් සොයා යන කාර්යය සංස්කෘතියක්.
- පිවිතුරු හා හරිත පරිසරයක් තුළින් අවියෝජනීයව අවශ්‍යතාවයන් ඉටු කර ගන්නා වූ ප්‍රසන්න පරිශ්‍රයක්.
- යහපානලමය යොමුවක්

1.3 ප්‍රධාන කාර්යයන්

<u>දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ආයතන අංශයේ කාර්ය භාරය.</u>

- කාර්යාලයේ පරිපාලනමය කටයුතු
- ආයතන කාර්ය (ආයතන, නිවාඩු, දුම්රිය බලපත්‍ර ආදිය)
- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පරිපාලන කටයතු හා අධීක්ෂණ කටයුතු
- ග්‍රාම නිළධාරීන්ගේ පරිපාලන කටයුතු
- වී මිල දී ගැනීම් කටයුතු

<u>දිස්ත්‍රික් ලෙක්ම් කාර්යාලයේ ගිණුම් අංශයේ කාර්යය භාරය</u>

- දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශිය ලේකම් කාර්යාල හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල අතර ප්‍රතිපාදන හා අක්මුදල් බෙදා හැරීම.
- දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල සම්බන්ධ ගිණුම් වාර්තා සකස් කිරීම හා ගණන්දීමේ නිලධාරී වෙත වාර්තා කිරීම.
- දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සියලුම ගෙවීම් කටයුතු
-

<u>දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පරිපාලනමය හා සම්බන්ධීකරණ අංශවල කාර්යය භාරය</u>

- කාර්යාලයේ පරිපාලනමය කටයුතු
- සමාජසේවා කටයුතු
- සංස්කෘතික හා ආගමික කටයුතු
- මානව සම්පත් සංවර්ධන හා කුසලතා වර්ධන පුහුණු කටයුතු
- උප්පැන්න, මරණ, විවාහ රෙජිස්ට්‍රාර්වරුන් හා හදිසි මරණ පරීක්ෂකවරුන් පත් කිරීම පිළිබඳ කටයුතු
- ජූරි සභික නාම ලේඛන සකස් කර අධිකරණයට ඉදිරිපත් කිරීම.
- දිස්ත්‍රික් මට්ටමේ ජාතික උත්සව හා විවිධ වැඩසටහන් සංවිධානය කිරීම.
- මහජන පැමිණිලි සම්බන්ධ කටයුතු
- රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානයන් හරහා සහයෝගය ලබාදීම.
- ආපදා කළමනාකරණ හා සුනාමි නැවත ගොඩනැංවීමේ කටයුතු
- ගිනි අවි හා පුපුරණ ද්‍රව්‍ය බලපත්‍ර කටයුතු
- සංචාරක නිවාස පිළිබඳ පරිපාලන කටයුතු

1.4 සංවිධාන සටහන - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අම්පාර



1.5 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා අනුබද්ධිත ආයතන

අම්පාර නගර මධ්‍යයේ සිට කිලෝමීටර් 01ක් පමණ උතුරට බරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිහිටා ඇත. දිස්ත්‍රික්කයේ පරිපාලනට අදාළ විශාල කාර්යය භාරයක් මෙම කාර්යාලය මගින් ඉටු කරනු ලැබේ. දිස්ත්‍රික් කාර්යාලය පිහිටි ගොඩනැගිල්ල ඉතා සවිමත් බවින් යුතු කලුගල් බැම්මෙන් ඉදිකරන ලද හා පැරණි ගොඩනැගිල්ලක් වන අතර එහි පෙෞඩත්වය ගල්ඔය ව්‍යාපාරය හා බැඳි පවතී. බොහෝ දෙනෙකු මෙය හඳුන්වන්නේ අම්පාර කච්චේරිය යන නමිනි. මෙම කච්චේරි පරිශ්‍රය තුළ විවිධ දෙපාර්තමේන්තු කාර්යාල හා විවිධ අංශවලින් සමන්විතය. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පාලනය වන ප්‍රාදේශීය ලේකම් කාර්යාල 20ක් ඇත. එම ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට ග්‍රාම සේවා වසම් 503 ක් අයත් වේ. ඒවා පහතින් දක්වා ඇත

අනු අංකය	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	ග්‍රාම සේවා වසම් සංඛ්‍යාව	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සිට ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට ඇති දුර
1	දෙහිඅත්තකණ්ඩිය	13	121
2	පදියතලාව	20	82
3	මහඔය	17	62
4	උහන	55	11
5	අම්පාර	22	-
6	දමන	33	17
7	ලාහුගල	12	80
8	පොතුවිල්	27	75
9	නිරුක්කෝවිල්	22	42
10	ආලයඩිවෙම්බු	22	28
11	අක්කරපත්තුව	28	28
12	අඩ්ඩාලච්චේන	32	29
13	ඉරක්කාමම්	12	10
14	නින්දවුර්	25	26
15	කාර්තිව්	17	24
16	සායින්දමරුදු	17	25
17	කල්මුණ	29	28
18	කල්මුණ උතුර (උපකාර්යාලය)	29	28
19	නාවිදන්වේලි	20	24
20	සම්මන්තුර	51	20

1.6 අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුව/පළාත් සභාව යටතේ පවතින ආයතන

අනු අංකය	දෙපාර්තමේන්තු කාර්යාල හා විවිධ අංශ
1.	දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලය
2.	සහකාර මැතිවරණ කොමසාරිස් කාර්යාලය
3.	දිස්ත්‍රික් මෝටර් රථ ප්‍රවාහන කාර්යාලය
4.	සමාජ ආරක්ෂක මණ්ඩලයේ අම්පාර දිස්ත්‍රික් කාර්යාලය
5.	දිස්ත්‍රික් ක්‍රම සම්පාදන කාර්යාලය
6.	මිනුම් ඒකක සහ ප්‍රමිති සේවා දෙපාර්තමේන්තුවේ අම්පාර දිස්ත්‍රික් කාර්යාලය
7.	දිස්ත්‍රික් සංඛ්‍යා ලේඛන කාර්යාලය.
8.	ආපදා කළමනාකරණ අංශය
9.	දිස්ත්‍රික් ක්‍රීඩා අංශය
10.	නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් කාර්යාලය
11.	සහකාර ඉඩම් කොමසාරිස් කාර්යාලය(පළාත්)
12.	දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බල මණ්ඩලය
13.	ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ අම්පාර දිස්ත්‍රික් කාර්යාලය
14.	අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලය.
15.	කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ සහතික කිරීමේ සේවා කාර්යාලය
16.	පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අම්පාර දිස්ත්‍රික් කාර්යාලය.

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (නිබේ නම්)

හිස් වාර්තාවකි.

02. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2021 වර්ෂය සඳහා ඉලක්ක සපුරා ගැනීම, ඒ සඳහා ඇති වූ අභියෝග හා 2022 වර්ෂයේ අපේක්ෂාවන්

2021 වර්ෂය තුළ දිස්ත්‍රික්කයේ සංවර්ධනය වෙනුවෙන් අප විසින් ඉටුකරන ලද කාර්යයන් සැකවින් පහත පරිදි වේ.

01. 2021 වර්ෂයේ කාර්ය සාධන ළඟා කර ගැනීම.

1. ලෝක ව්‍යසනයක් වූ කොවිඩ්-19 වසංගතයේ ඩෙල්ටා ප්‍රභේදයේ උච්චතම අවස්ථාව මෙම වර්ෂය වූ අතර ඒ සඳහා සෞඛ්‍ය අංශය, යුධ හමුදාව, පොලිසිය ඇතුළු සමස්ථ රාජ්‍ය සේවයම පූර්ණ මැදිහත් වීම මත ඒය සාර්ථක ආකාරයට කළමනාකරණය කරගත හැකිවීම.

2. කොවිඩ්-19 හේතුවෙන් වසර තුළ වරින් වර නිරෝධායන ඇදිරි නීතිය කිහිප වරක් පණවනු ලැබූවද? අඛණ්ඩ රාජ්‍ය සේවයක් මහජනතාව වෙත ලබා දීම සහතික කරන ලදී.

3. නිරෝධායන ඇදිරි නීතිය පනවනු ලැබූ කාලසීමාව තුළ කිසිදු හිඟයකින් තොරව මහජනතාවට අවශ්‍ය අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය ඇතුළු සියලුම පහසුකම් අඛණ්ඩව ඔවුන් වෙත ලබා දීමට කටයුතු කිරීම.

4. රජයේ ඉදිරි දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව වස විසෙන් තොර කෘෂිකර්මාන්තයක් නිරෝගී පරපුරක් යන තේමාව යටතේ කාබනික පොහොර භාවිතයෙන් වී ගොවිතැන ඇතුළු අනෙකුත් වගාව සඳහා දිස්ත්‍රික්කයේ ගොවීන් අනුගත කිරීම සඳහා මෙන්ම කාබනික පොහොර නිෂ්පාදනය සඳහා ගොවීන් පුහුණු කිරීම සහ 2021 වර්ෂයේ මහ කන්නයේ වී වගාව ඇතුළු අනෙකුත් වගාවන් සාර්ථකව එම ක්‍රමය භාවිතයෙන් සිදුකිරීම.

5. රජයේ ප්‍රතිපත්තියට අනුව දේශීය නිෂ්පාදන ඉහළ දැමීම සඳහා ආනයන ආදේශන නිෂ්පාදන ලෙස කහ, මුං, බඩඉරිඟු වැනි වගාවන් දිස්ත්‍රික්කය තුළ ප්‍රචලිත කිරීම සඳහා කටයුතු කිරීම සහ එමඟින් රටෙහි සමස්ථ කෘෂි නිෂ්පාදනයට ඉහළ දායකත්වයක් දිස්ත්‍රික්කයෙන් ලබා දීම.

6. ගංඟා, ඇළ මාර්ග ඇතුළු ජල පෝෂකයන් ආරක්ෂා කිරීම සඳහා "සුරැකුම් ගංඟා" ජාතික වැඩසටහන යටතේ විශාල වැඩ කොටසක් සිදුකිරීම සහ පරිසර ආරක්ෂණය සහ වන වගා ව්‍යාපෘති විශාල සංඛ්‍යාවක් දිස්ත්‍රික්කය තුළ සිදුකිරීම.

7. මහාමාර්ග, පානීය ජලය, අධ්‍යාපන, සනීපාරක්ෂක, නිවාස සහ අනෙකුත් යටිතල පහසුකම් සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් රු.මි.3493.45 සහ අනෙකුත් රේඛීය අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු මඟින් 2021 වර්ෂයේ රු.මි.12127.1 මුදලක් ද ඇතුළුව එම වර්ෂයේ මුළු සංවර්ධන ආයෝජන රු.මි.15620.55 වූ අතර එම ව්‍යාපෘති 2021 වර්ෂය තුළ සාර්ථකව අවසන් කරන ලදී. සමහරක් දිගුකාලීන හා අඛණ්ඩ සංවර්ධන ව්‍යාපෘති පමණක් එළඹෙන වර්ෂවල ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

8. නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ ග්‍රාමීය මට්ටමේ ප්‍රජා මූල සමිති ශක්තිමත් කිරීම සහ ජනතාව සවිබල ගැන්වීම, ග්‍රාමීය නිෂ්පාදන ප්‍රවර්ධනය සහ ග්‍රාමීය යටිතල පහසුකම් ප්‍රවර්ධනය සඳහා කටයුතු කිරීම.

9. අලි මිනිස් ගැටුම අවම කිරීම සඳහා ජාතික විදුලි වැට පද්ධතියට 200km වඩා දුරින් යුත් නව අලි වැට පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය වැට මාර්ග සුද්ද කිරීම හා ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම. එසේම නව විදුලි අලිවැට සංකල්පය යටතේ එල්ලෙන අලිවැට නියමු ව්‍යාපෘතියක් ලෙස දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කරන ලදී.

10. ස්වභාවික ආපදා වන ජල ගැලීම් පාලනය සඳහා විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කළ අතර ගංවතුරින් විනාශ වූ මහාමාර්ග මෙන්ම පාලම් කිහිපයක් ඉදිකිරීමට කටයුතු කිරීම.

11. රාජ්‍ය සේවක භාෂා නිපුණතාවයන් ඉහළ දැමීම සඳහා විදේශ රාජ්‍ය නොවන සංවිධානයක් වන USAID ආයතනයේ සහාය සහිතව රාජ්‍ය සේවා පුහුණු මධ්‍යස්ථානය රුපියල් මිලියන 10ක් වැයකරමින් සුහුරු පන්නි කාමර සංකල්පය යටතේ දියුණු කිරීමට අදාළ මූලික පියවර ගැනීම සහ නවීන තාක්ෂණය භාවිතයට ගනිමින් මාර්ගගත රැස්වීම් ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා එම මධ්‍යස්ථානයේම පහසුකම් සංවර්ධනයට පියවර ගැනීම.

12. දිස්ත්‍රික්කය ඉමහළ දේශීය සහ විදේශීය සංචාරක ආකර්ෂණයක් සහිත දිස්ත්‍රික්කයක් වන බැවින් සංචාරක ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය සඳහා පහසුකම් වැඩිදියුණු කිරීම සහ වසර 10ක දිගුකාලීන සංචාරක සැලැස්මක් ආරුගම්බේ ජාත්‍යන්තර සංචාරක කලාපය සඳහා පිළියෙල කිරීම.

<u>කාර්ය සාධන ළඟාකර ගැනීමේදී මුහුණදීමට සිදුවූ අභියෝග</u>

2021 වර්ෂයේ ඉලක්ක ළඟාකර ගැනීමට කටයුතු කිරීමේදී අපහට පාලනය කරගත නොහැකි තත්ත්වයන්ට මෙන්ම අපට කළමනාකරණය කරගත හැකි තත්ත්වයන්ටද අප මුහුණදුන් අතර ඒවා පහත පරිදි විය.

1. කොවිඩ්-19 ගෝලීය වසංගත වාර්තාගත ලෙස ඉහළ යාම සහ ඒ මත අවස්ථා කිහිපයකදීම නිරෝධායන ඇදිරිනීතිය පැනවීම.

2. නිරෝධායනය කළ පිරිස් වෙත අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය සහ අනෙකුත් මූලික පහසුකම් සැපයීමේදී රාජ්‍ය සේවකයන්ගේ සෞඛ්‍යාරක්ෂිත බව රැකීමට සිදුවීම නිසා ඔවුන්ගේ සේවය ලබා ගැනීමේදී සිදුවූ අපහසුතා

3. කාබනික පොහොර වගාව සඳහා ගොවි ජනතාව පෙළඹවීම සහ අදාළ තාක්ෂණික සහාය ඔවුන් වෙත ලබා දීමේදී දශක කිහිපයක සිට ඔවුන් සතුව පැවති ආකල්ප වෙනස් කිරීම අපහසු වීම.

4. සංවර්ධන කටයුතු වෙනුවෙන් භාවිතයට ගනු ලබන අමුද්‍රව්‍ය මිල ගණන් අවස්ථා කිහිපයකදීම ඉහළ යාම සහ අමුද්‍රව්‍යවල පැවති හිඟය ආදී හේතූන් නිසා ඇස්තමේන්තු වෙනස් කිරීමටත්, ටෙන්ඩර් ලබාගත් කොන්ත්‍රාත්කරුවන් සහ භාණ්ඩ සැපයුම්කරුවන් ගිවිසුම් ප්‍රකාරව අදාළ කාර්යය අවසන් කිරීමට කටයුතු නොකිරීමේ තත්ත්වයක් උද්ගත වීම.

02. <u>2022 වර්ෂයේ අනාගත අපේක්ෂාවන්</u>

මේවන විට ලෝක ව්‍යවසනයක් වූ කොවිඩ්-19 ලොවින් මෙන්ම ලංකාවෙන්ද තුරන්ව ගොස් නොමැති පසුබිමක මෙන්ම පවතින ආර්ථික තත්ත්වයන් යටතේ එය මනා කළමනාකරණයකින් යුත්කව දිස්ත්‍රික්කයේ ජනතාව වෙත යහපත් රාජ්‍ය සේවයක් සැලසීම සහ අඛණ්ඩ ආර්ථික වර්ධනයකට දිස්ත්‍රික්කයේ දායකත්වය ලබා දීම සහතික කිරීම සඳහා පහත සැලසුම් ක්‍රියාත්මක කිරීමට නියමිතය.

1. කළුගල්ඔය සංවර්ධන ව්‍යාපෘතිය ජනතා අයිතියට පත්කිරීම සහ එමඟින් නව කුඹුරු අස්වැද්දවීම, මිරිදිය මත්ස්‍ය කර්මාන්තය ප්‍රවර්ධනය

2. අතුරු නිෂ්පාදන ලෙස කහ, මුං, කව්පි, බඩඉරිඟු සහ විශේෂයෙන්ම කිරි නිෂ්පාදන දිස්ත්‍රික්කය තුළ ප්‍රචලිත කිරීම සහ එමඟින් ජාතික නිෂ්පාදනය ඉහළ අගයක් කරා රැගෙන යාමට හැකි පරිදි අදාළ කටයුතු සැලසුම් කිරීම.

3. අලි මිනිස් ගැටුම අවම කිරීම සඳහා අලි වැට සංවර්ධන ව්‍යාපෘතිවලට සමගාමීව අගල් ඉදිකිරීමේ ව්‍යාපෘති ද දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කිරීම සහ එතුළින් වගාවන්ට සිදුවන හානියද අවම කිරීම.

4. "ගම සමඟ පිළිසඳර" වැඩසටහන යටතේ දිස්ත්‍රික්කය වෙත ලද රුපියල් බිලියන 4 ඉක්ම වූ ප්‍රතිපාදන භාවිතයට ගනිමින් ග්‍රාමීය නිෂ්පාදන වැඩිදියුණු කිරීම, ඒ මත කාන්තා ව්‍යවසාය ප්‍රවර්ධනය සහ ග්‍රාමීය දූගීබව අවම කිරීම සඳහා කටයුතු කිරීම. එසේම උණ සේවා නියුක්ත තරුණ ශ්‍රමය ඵලදායී ආකාරයට උපයෝජනය සඳහා මෙම වැඩසටහන්වලට සමගාමීව කටයුතු කිරීම.

5. 2025 වන විට ඝනත්වය 30% මට්ටමකට ළඟාකර ගැනීම සඳහා ක්‍රියාත්මක වන ජාතික වැඩසටහන් සඳහා අම්පාර දිස්ත්‍රික්කයෙන් සක්‍රීය දායකත්වය ලබා දීම.

6. දිස්ත්‍රික්කයේ අධ්‍යාපන, සෞඛ්‍ය වැනි අත්‍යාවශ්‍ය සේවාවන් තව තවත් ප්‍රවර්ධනය සඳහා පියවර ගැනීම.

7. දිස්ත්‍රික්කයේ වෘත්තීය අධ්‍යාපනය ඉහළ මට්ටමකට රැගෙන ඒම සඳහා යටිතල පහසුකම් ප්‍රවර්ධනයට අවශ්‍ය පියවර ගැනීම.

ජේ.එම්.ඒ.ඩග්ලස්,
දිසාපති / දිස්ත්‍රික් ලේකම්,
අම්පාර දිස්ත්‍රික්කය.

03 පරිච්ඡේදය - 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ථ මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

						` v `-
	Ò¸dzк_ qf ₹ J ₹,, Ç_ , - ¯J ,,					
	2021_ ' .. ¬ J Ç 31 Ò¸ Z ¯ J .. Z J. Ç .. ,, ,,					
	ſ_ ʒ ₹,, Ç ,' ¸ Ɛ ₹,, ,					
					н.	
2021 ¯ , ¬			¸ ˇ ,,	' ' ʒ ¸ ¬ ' ´ _ , , _ '		
				2021	2020	
-	"' ,, J_ ¬ ı J					
-	"' ,, J ¬ Ô		1	-	-	
-	_ Ì ſ , ' ¸ ǔ" ¸ , .. ‚ ' ¬ Ô		2	-	-	` v `-1
-	' ¸ ' ʒZ' , _ , , , , ' ¬ Ô		3	-	-	
-	¬ Ô ¸ ,, ¸ "' ,, J ¸ , _ , ¸ Q̄		4	-	-	
-	ſ ˇ "' ,, J_ ¬ ı J (¯)			-	-	
	"' ,, J_ , ,, ¸ _ ¬ ı J					
-	' ¸ ǔ" ¸ ´ ,, ¯Ş			4,744,133,000	4,737,886,844	` v `-3
-	' ¬ Z, ǯ			411,124,440	1,281,172,265	` v `-4
48,000,000	¯Q̄ǫ ₹,, J ɻ ə J			62,172,640	51,871,861	` v `-5
-	_ , ¸ Q̄ Ɛ ,, _ _ ˙ Ç ɻ ə J_ ¬ ı J			-	-	
48,000,000	ſ ˇ "' ,, J_ , ,, ¸ _ ¬ ı J (")			**5,217,430,080**	**6,070,930,970**	
48,000,000	ſ ˇ "' ,, J_ ¬ ı J .. ¸ "' ,, J_ , ,, ¸ _ ¬ ı J ˛ = (¯)+(")			**5,217,430,080**	**6,070,930,970**	
	' ¸ ǔ" ´ ,, ¸ ˇ _ ʒ ˚ **(˛)**			-	-	
	¸ Ì "' ,, J_ ¬ ı J .. ¸ "' ,, J_ , ,, ¸ _ ¬ ı J ˛ = (˛)-(˛)			**5,217,430,080**	**6,070,930,970**	
	¯Nj ₹,, , : tǫ ' J					
	ə ¸ ,, ' Ç tǫ ' J					
928,700,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ		5	926,830,335	877,647,057	
211,730,000	අනෙකුත් භාණ්ඩ හා සේවා		6	133,500,465	111,102,181	` v `-2(ii)
343,411,000	ඍහනාධාර , ප්‍රදාන සහ මාරුකිරීම්		7	333,241,486	4,085,699	
-	_ , , _ ´ fŋJ		8	-	-	
-	_ , ¸ Q̄ ə ¸ ,, ' Ç tǫ ' J		9	-	-	
1,483,841,000	ſ ˇ ə ¸ ,, ' Ç tǫ ' J (˛)			**1,393,572,286**	**992,834,937**	
	ſ_ ' ¸ tǫ ' J					
19,200,000	ſ_ ' ¸ , Q̄ ₹ J ə н Q̄ ,, , ¸ , ¸ , ¬ ljÒzə Ĺ ɢJ		10	17,608,631	9,812,386.00	
122,300,000	ſ_ ' ¸ , Q̄ ₹ J ¯Q̄ Q̄ ₹, ´ ¬ Ȧ J		11	57,178,718	48,429,153.00	
-	ɛ Ŗ ¸ , , н Ĺ ɢJ		12	-	-	` v `-2(ii)
-	ſ_ ʒ, Q̄ ₹ J ¯Q̄ Q̄ ₹, ´ ¬ Ȧ		13	-	-	
2,000,000	¸ ¬ Ĺ, , ¸ ' Ç ,		14	842,590	397,059.00	
-	_ , ¸ Q̄ ſ_ ' ¸ tǫ ' J		15	-	-	
143,500,000	ſ ˇ ſ_ ' ¸ tǫ ' J (˛)			**75,629,940**	**58,638,598**	
-	' ¬ Z, ǯ_ ´ fŋJ			454,551,929	1,430,153,353	` v `-4
75,000,000	¯Q̄ǫ ₹,, J_ ´ fŋJ			54,133,289	48,317,946	` v `-5
	_ , ¸ Q̄ Ɛ ,, _ _ ˙ Ç ɻ ə J_ ´ fŋJ			-	-	
	Ɛ ,, _ _ ˙ Ç tǫ ' J (¸)			**508,685,218**	**1,478,471,299**	
	ſ ˇ tǫ ' J ˊ = (˛+ ˛+ ¸)			1,977,887,444	2,529,944,834	
-	_ ' .. ¬ J Ç 31 Ò ˇ _ ₹,, , ` = (˛- ˇ)			**3,239,542,636**	**3,540,986,136**	
75,000,000	¯Ŝ .. ¬. Ł J Ɛ ₹,, , ¯ä, _ ₹,, ,			3,239,542,636	3,540,986,136	` v `-7
	_ ' .. ¬ J Ç 31 Ò ˇ ¯Ş _ ₹,, ,			-	-	` v `-3
				-	-	

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

		2021	2020
		රු.	රු.
වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ- 6	3,423,420,682	1,427,194,087
ආයෝජන			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ- 5/5(ඒ)	201,695,368	207,910,789
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ- 3	-	-
මුළු වත්කම්		**3,625,116,050**	**1,635,104,876**
ප්‍රාග්ධනය හා වගකීම්			
ශුද්ධ වත්කම්		36,070,403	(1,141,665)
දේපළ පිරියත හා උපකරණ සංචිතය		3,423,420,682	1,427,194,087
වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ- 4		
අග්‍රිම ශේෂය	ඒසීඒ- 3	**165,624,965**	209,052,454
මුළු ප්‍රාග්ධනය හා වගකීම්		**3,625,116,050**	**1,635,104,876**

පිටු අංක 7 සිට 29 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 30 සිට 37 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තගර්ත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් ස්ථාපිත කරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන් දීමේ නිලධාරී
එන්.එච්.එම්.චිත්‍රානන්ද
ලේකම්, ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය
දිනය : 2022.02.22

ගණන්දීමේ නිලධාරී
ජේ.එම්.ඒ.ඩග්ලස්
දිස්ත්‍රික් ලේකම්
දිනය : 2022.02.21

ප්‍රධාන ගණකාධිකාරී
එස්.එල්.ආදම්බාවා,
දිස්ත්‍රික් ලේකම් කාර්යාල
දිනය : 2022.02.21

එන්.එච්.එම්. චිත්‍රානන්ද
ලේකම්
ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය

ජේ.එම්.ඒ. ඩග්ලස්
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
අම්පාර දිස්ත්‍රික්කය

එස්.එල්. ආදම්බාවා
ප්‍රධාන ගණකාධිකාරී
අම්පාර දිසාපති වෙනුවට

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-සි

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අම්පාර

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

රු

	නත්‍ය නැවත ගලපන ලද 2021	2020
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙතුවෙන් එකතු කරන ලද ආදායම්	318,688,155	557,983,460
අග්‍රිම ලැබීම්	4,744,133,000	4,737,886,844
අත්තිකාරම් අයකර ගැනීම්	79,785,572	66,243,356
තැන්පතු ලැබීම්	411,124,440	1,281,172,265
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**5,553,731,167**	**6,643,285,926**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	1,060,268,735	987,997,273
සහනාධාර සහ මාරුකිරීම්	333,241,486	4,085,699
වෙනත් වැය ශීර්ෂ වෙතුවෙන් දරන ලද වියදම්	3,555,365,455	2,553,362,495
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	-	18,000,000
අත්තිකාරම් ගෙවීම්	74,673,623	65,855,743
තැන්පතු ගෙවීම්	454,551,929	1,430,153,353
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**5,478,101,228**	**5,059,454,563**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**75,629,940**	**1,583,831,363**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	75,629,940	1,583,831,363
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**75,629,940**	**1,583,831,363**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(75,629,940)**	**(1,583,831,363)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදාන‍යන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

ඒසිඒ - 1

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය

ආදායම් ගණන්දීමේ නිලධාරී : දිස්ත්‍රික් ලේකම්

වියදම් ශීර්ෂ ආකය : 270

රු.

ආදායම් සංකේතය	ආදායම් විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		ආදායම් රැස්කිරීම්				ආදායමෙන් ආපසු ගෙවීම්			
		(1)		(2)			(3)	(4)			(5)
		මූලික ඇස්තමේන්තුව	සංශෝධිත ඇස්තමේන්තුව	අදාළ අමාත්‍යාංශය /දෙපාර්තමේන්තුව විසින් රැස්කිරීම්	වෙනත් අමාත්‍යාංශ /දෙපාර්තමේන්තු විසින් රැස්කිරීම් (SA-21)	එකතුව	නිහ ආදායම් රැස්කිරීම්	මුදලින්	වැරදි නිවැරදි කිරීම්	එකතුව	ශුද්ධ ආදායම
		1(i)	1(ii)	2(i)	2(ii)	2(iii)=2(i)+2(ii)	(3)	4(i)	4(ii)	4(iii)=4(i)+ 4(ii)	5=2(iii)+(3)-4(iii)
					අදාළ නොවන						
	මුළු එකතුව										

ප්‍රධාන ගණකාධිකාරී
එස්.එල්.ආදම්බාවා,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
දිනය : 2022.02.

එස්.එල්. ආදම්බාවා
ප්‍රධාන ගණකාධිකාරී
අම්පාර දිසාපති වෙනුවට

ආදායම් ගණන් දීමේ නිලධාරී
ජේ.එම්.ඒ.ඩග්ලස්
දිස්ත්‍රික් ලේකම්
දිනය : 2022.02.

ජේ.එම්.ඒ. ඩග්ලස්
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
අම්පාර දිස්ත්‍රික්කය

7

2021 ' _ Ĵ Ć31 Ò. Ƶ ¨ Ƶ . Ć . tɕ ' ɹ ɛ

: 270

: Ò dzĸ _ ɗ ɹ Ƶ ǯ

රු.

1001	වැටුප් හා වේතන	11	635,000,000	-	(15,500,000)	619,500,000	619,258,551	-	619,258,551	241,449	0	අනියම් ඉතිරියකි
1002	අතිකාල හා නිවාඩු දින වැටුප්	11	46,000,000	-	8,000,000	54,000,000	53,889,218	-	53,889,218	110,782	0	අනියම් ඉතිරියකි
1003	වෙනත් දීමනා	11	222,900,000	-	7,500,000	230,400,000	230,069,956	62,065	230,132,021	267,979	0	අනියම් ඉතිරියකි
			903,900,000	-	-	**903,900,000**	**903,217,725**	**62,065**	**903,279,790**	**620,210**		
1101	දේශීය	11	23,800,000	-	-	23,800,000	22,850,546	-	22,850,546	949,454	4	අනියම් ඉතිරියකි
			23,800,000	-	-	**23,800,000**	**22,850,546**	-	**22,850,546**	**949,454**		
Supplies												
1201	ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා	11	18,300,000	-	-	18,300,000	18,272,175	-	18,272,175	27,825	0	ව්‍යදම් පාලනය කිරීම
1202	ඉන්ධන	11	17,300,000	-	-	17,300,000	15,385,979	-	15,385,979	1,914,021	11	Covid - 19 වෛරස තත්ත්වය හේතුවෙන් ක්ෂේත්‍ර රාජකාරී අවම කිරීම
1203	ආහාර පාන හා නිල ඇඳුම්	11	550,000	-	-	550,000	494,000	-	494,000	56,000	10	ˆÔ ¨ Ôl ɹ н, Ƶ . ^Ɛ
1205	Ò	11	-	50,000,000	-	50,000,000	9,472,942		9,472,942	40,527,058		
			36,150,000	**50,000,000**	-	**86,150,000**	**43,625,096**	-	**43,625,096**	**42,524,904**		
1301	වාහන	11	18,800,000	-	-	18,800,000	18,538,316	-	18,538,316	261,684	1	ව්‍යදම් පාලනය කිරීම
1302	යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ	11	5,800,000	-	(450,000)	5,350,000	5,082,637	-	5,082,637	267,363	5	ව්‍යදම් පාලනය කිරීම
1303	ගොඩනැගිලි සහ ඉදිකිරීම්	11	15,500,000	-	-	15,500,000	15,201,347	-	15,201,347	298,653	5	අනියම් ඉතිරියකි
			40,100,000	-	**(450,000)**	**39,650,000**	**38,822,300**	-	**38,822,300**	**827,700**		
1401	ඉ		-	-	450,000	450,000	450,000	-	450,000	-		
1402	තැපැල් හා සන්නිවේදන	11	9,200,000	-	-	9,200,000	7,405,329	-	7,405,329	1,794,671	20	ව්‍යදම් පාලනය කිරීම
1403	විදුලිය හා ජලය	11	18,800,000	-	(1,823,931)	16,976,069	14,665,102	-	14,665,102	2,310,967	14	ව්‍යදම් පාලනය කිරීම
1404	බදු කුලී සහ පළාත් පාලන ආයකන	11	600,000	-	-	600,000	588,835	-	588,835	11,165	2	අනියම් ඉතිරියකි
1409	වෙනත් දීමනා	11	27,700,000	-	-	27,700,000	26,819,871	-	26,819,871	880,129	3	අනියම් ඉතිරියකි
			56,300,000	-	**(1,373,931)**	**54,926,069**	**49,929,137**	-	**49,929,137**	**4,996,931**	9	
			156,350,000	**50,000,000**	**(1,823,931)**	**204,526,069**	**155,227,079**	-	**155,227,079**	**49,298,989**		
1501		11	-	339,161,000	-	339,161,000	329,836,288		329,836,288	9,324,712	3	ˆÔ ¨ Ôl ɹ н, Ƶ . ^Ɛ
1506	රජයේ සේවකයින් සඳහා දේපළ රක්‍ෂණ පොලි	11	5,250,000	-	-	5,250,000	3,405,197	-	3,405,197	1,844,803	35	දේපළ රක්‍ෂණය සඳහා අයදුම් නොකිරීම
1701	පාඩු සහ කපාහැරීම්	11			1,823,931	1,823,931	1,823,931		1,823,931			
	to 9)		**1,065,500,000**	**389,161,000**	-	**1,454,661,000**	**1,393,510,221**	**62,065**	**1,393,572,286**	**61,088,714**		

2001	ගොඩනැගිලි සහ ඉදිකිරීම්	11	12,000,000	-	-	12,000,000	11,865,607	-	11,865,607	134,393	1	අනියම් ඉතිරියකි
2002	යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ	11	2,000,000	-	-	2,000,000	1,807,036	-	1,807,036	192,965	10	ගෙවීම් කිරීමට
2003	වාහන	11	5,200,000	-	-	5,200,000	3,935,989	-	3,935,989	1,264,011	24	අවශ්‍යතාවයක් ඇති නොවීම
			19,200,000	-	-	**19,200,000**	**17,608,631**	-	**17,608,631**	**1,591,369**		
2102	ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ	11	16,500,000	-	-	16,500,000	16,497,563	-	16,497,563	2,437	0	අනියම් ඉතිරියකි
2103	යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ	11	15,800,000	-	-	15,800,000	15,799,931	-	15,799,931	69	0	අනියම් ඉතිරියකි
2104	ගොඩනැගිලි සහ ඉදිකිරීම්	11	90,000,000	-	-	90,000,000	24,881,224	-	24,881,224	65,118,776	72	අනියම් ඉතිරියකි
			122,300,000	-	-	**122,300,000**	**57,178,718**	-	**57,178,718**	**65,121,282**		
2401	කායර් මණ්ඩල පුහුණු	11	2,000,000	-	-	2,000,000	842,590	-	842,590	1,157,410	58	ගෙවීම් කිරීමට අවශ්‍යතාවයක් ඇති නොවීම
			2,000,000	-	-	**2,000,000**	**842,590**	-	**842,590**	**1,157,410**		
2509	වෙනත්	11	-	100,000,000		100,000,000	-			100,000,000	100	
			-	**100,000,000**	-	**100,000,000**	-	-	-	**100,000,000**		
			143,500,000	**100,000,000**	-	**243,500,000**	**75,629,940**	-	**75,629,940**	**167,870,060**		
			1,209,000,000	**489,161,000**	-	**1,698,161,000**	**1,469,140,161**	**62,065**	**1,469,202,226**	**228,958,774**		

ප්‍රධාන ගණකාධිකාරී
එස්.එල්.ආදම්බාවා,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
දිනය : 2022.02. 21

එස්.එල්. ආදම්බාවා
ප්‍රධාන ගණකාධිකාරී
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
අම්පාර

[illegible]-3

2021 [illegible]

[illegible]

[illegible] : 270 H.

[illegible]	2021 [illegible] 01 [illegible]			[illegible]			[illegible]			2021 [illegible] 31 [illegible]			2021 [illegible] 31 [illegible]	2021 [illegible] 31 [illegible]
	1			2			3			4				
	[illegible]	[illegible]	[illegible]	[illegible]	[illegible]	[illegible]	[illegible]	[illegible]	[illegible]	[illegible]	[illegible]	[illegible]	*5	6
	1(i)	1(ii)	1(iii)	2(i)	2(ii)	2(iii)=2(i)+2(ii)	3(i)	3(ii)	3(iii)=3(i)+3(ii)	4(i)	4(ii)	4(iii)=4(i)+4(ii)	**5=1(iii)+2(iii)-3(iii)**	
7002/0/0/288/0/21	-	-	-	4,744,133,000	679,849,865	5,423,982,865	5,423,982,865	-	5,423,982,865	-	-	-	-	-

1. [illegible] 4 [illegible] 6 [illegible]
   (1) [illegible] 2021.12.31 [illegible] -
   (2) [illegible] - ..... -
   -

මෙම ශේෂ වාර්තාව අත්සන් කරන දින වන විට පියවා ඇත්නම් ඒ බව ද, නොඑසේ නම් නොපියවීමට හේතු සඳහන් කරන්න.
ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවට සහතික කරමි.

ප්‍රධාන ගණකාධිකාරී
එස්.එල්.ආදම්බාවා,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
දිනය : 2022.02. 21

* මෙම ශේෂය මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි පෙන්විය යුතු ය.

එස්.එල්. ආදම්බාවා
ප්‍රධාන ගණකාධිකාරී
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
අම්පාර

19

2021 ' _ _ Ĵ ⊂31 Ò ˇ ' _ Z, Ō ŗ ə J ɖ . ¬ _ ε , , , _

tɕ ' J . ' C ⁼ ₊ , : 270 ⁼ , ' ʒ ₊ / _ ' , ' C J Z ǯ : Ò ɖ dzĸ _ ɖ ₊ J ₊ , , C _ , ⁼ J , ,

' _ Z, ǯ ŗ ə _ J , ,	' _ Z, ǯ ⁼ ₊ ,	2021 ˙ , , , ə01 Ò ˇ _ ₊ , ,	, . C ǯ ¬ ⁻ Ĺ ɕ J	, . C ǯ ∘ . Ĺ ɕ J	2021 _ ' .. _ Ĵ C 31 Ò ˇ _ ₊ , ,	2021 _ ' .. _ Ĵ C 31 Ò ˇ ' , ŭ " ' , , . _ , , Ō ⁼ ȧ , _ ₊ , ,
		Rs.	**Rs.**	**Rs.**	**Rs.**	**Rs.**
තැන්පතු ගිණුමේ නම						
(i) ඇප තැන්පත්	6000/0/0/0001/0089	1,967,457	5,468,006	3,024,858	4,410,605	**4,410,605**
(ii) ටෙන්ඩර් තැන්පත්	6000/0/0/0002/0119	2,657,344	2,350,088	2,274,905	2,732,527	**2,732,527**
(iii) පළාත් සභා වෙත ආදායම් ප්‍රේෂණය කිරීම	6000/0/0/0014/0013	9,020,861	70,936,794	67,006,634	12,951,021	**12,951,021**
(iv) කොන්ත්‍රාත් සඳහා වූ රැඳවුම් මුදල්	6000/0/0/0016/0067	134,595,988	26,761,163	92,715,508	68,641,643	**68,641,643**
(v) වන්දි ගෙවීම්	6000/0/0/0017/0020	0	-	-	0	**0**
(vi) වියදම් ප්‍රතිපූරණය සඳහා අරමුදල් ලැබීම	6000/0/0/0020/0011	60,810,804	305,608,388	289,530,024	76,889,168	**76,889,168**
ɾ ˇ ' ₊ ǯ		**209,052,454**	**411,124,440**	**454,551,929**	**165,624,965**	**165,624,965**

ප්‍රධාන ගණකාධිකාරී
එස්.එල්.ආදම්බාවා,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
දිනය : 2022.02.

එස්.එල්. ආදම්බාවා
ප්‍රධාන ගණකාධිකාරී
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
අම්පාර

2021 ' _] (31 Ò ˇ ¯ Q ō ₹ ₊ ₊] ŗ ə ₹ _

tę '] ŗ C ¯ ₹ ₹ : 270

¯ ₹ ' ʒ ł ₹ / _ ' ₹ ' C] Z ʒ : Ò ¿ d z ĸ _ ď ₹] ₹ ₊ C ₹ ₹ ¯] ₹ ₊

(රු.)

| ¯ Q ō ₹ ₊ ₊] ŗ ə _] ₹ ' | ¯ Q ō ₹ ₊ ₊] ŗ ə] ¯ ₹ ₹ | ¯ Q ō ₹ ₊ ₊] ŗ ə] ₹ ₹ ʒ | 2021 ˇ ₹ ₹ ə 01 Ò ˇ _ ₹ ₹ ₹ | tę ' _ ₹ _ ₹ ə v ₹ ₹ н. | | _ ₹ ı] _ ₹ ₹ v ₹ ₹ н. | | ₹ _ ₹ ₹ Z R ₹ ə v ₹ ₹ н. | ¬ ₹ ₹] ď ₹ ₹ ə v ₹ ₹ н. | 2021 _ ' ₹ ₹ ₹] (31 Ò ˇ ₹ ₹ ₹

New CIGAS Web Application

MENU

Report

XXXX: **LBL** XXX: **LBL** Sign Out

Label

Generate

Cumulative Non Financial Asset Accounts Report- Central Govt- 2021

Land-9153:	1,479,609,000.00	**Table:**	SA 82
Building- 9151:	1,222,861,770.84	**Year:**	2021
Machinary-9152:	661,191,395.59	**Rpt Date**	2/18/2022 8:42:48 AM
WIP-9160:	59,758,515.56	**Head**	270
Intangible-9154:	**0.00**		
Lease-9180:	**0.00**		

Ledger	category	Item	Code	Opn_Bal	Opn_Bal_Add	TransferIn	Purchase	Disposal	Balance
9151--	1.1-		61111	69,914,382.60	310,194,000.00	0.00	0.00	5,049,516.00	375,058,866.60

https://newcigas.treasury.gov.lk/Rpt/Head_Asset_2021

25

1/4

>	Dwellings								
		Garages	****6111102	3,577,593.62	0.00	0.00	0.00	549,516.00	3,028,077.62
		Hotels & Restaurants	****6111106	2,581,118.43	0.00	0.00	0.00	0.00	2,581,118.43
		Quarters	****6111107	44,685,670.55	310,194,000.00	0.00	0.00	4,500,000.00	350,379,670.55
		Circuit Bunglows	****6111108	19,070,000.00	0.00	0.00	0.00	0.00	19,070,000.00
9151-->	1.2-Non Residential Building		61112	547,069,764.59	305,602,000.00	0.00	2,466,240.65	7,335,101.00	847,802,904.24
		Office Building	****6111201	544,083,061.64	305,602,000.00	0.00	0.00	7,335,101.00	842,349,960.64
		Building for Public Entertainment	****6111204	2,986,702.95	0.00	0.00	2,466,240.65	0.00	5,452,943.60
9160-->	1.4-WIP-Building & Structure		61114	37,343,532.52	21,554,638.69	0.00	860,344.35	0.00	59,758,515.56
		WIP-Building & Structure	****611140	36,786,684.52	10,533,591.19	0.00	0.00	0.00	47,320,275.71
		Building for Public Entertainment	****6111411	0.00	0.00	0.00	860,344.35	0.00	860,344.35
		Office Building	****611148	556,848.00	11,021,047.50	0.00	0.00	0.00	11,577,895.50
9152-->	2.1-Transport Equipment		61121	289,091,100.00	50,000.00	0.00	0.00	82,600.00	289,058,500.00
		Passenger vehicle	****6112101	279,521,100.00	0.00	0.00	0.00	12,600.00	279,508,500.00
		Agricultural vehicle	****6112103	9,145,000.00	0.00	0.00	0.00	0.00	9,145,000.00
		Motor cycle	****6112109	425,000.00	50,000.00	0.00	0.00	70,000.00	405,000.00

9152-->	2.2-Other Machinary & Equipment		61122	340,426,790.59	14,696,583.50	0.00	23,500,013.50	6,490,492.00	372,132,895.59
		Office Equipment	****6112201	37,172,733.50	1,080,046.50	0.00	2,732,565.00	419,190.00	40,566,155.00
		Computer Equipment	****6112202	98,415,513.90	6,230,085.20	0.00	8,417,777.00	2,629,700.00	110,433,676.10
		Electrical Equipment	****6112203	50,913,811.25	1,326,379.00	0.00	4,383,869.00	1,355,012.50	55,269,046.75
		Communication Equipment	****6112204	12,689,731.27	376,210.00	0.00	1,807,455.00	52,500.00	14,820,896.27
		Furniture	****6112205	140,233,040.67	5,547,010.80	0.00	6,158,347.50	2,013,389.50	149,925,009.47
		Sports equipment	****6112208	12,200.00	0.00	0.00	0.00	0.00	12,200.00
		Paintings Sculptures & other Antiques	****6112209	6,400.00	0.00	0.00	0.00	0.00	6,400.00
		Books Periodical & Journals	****6112210	8,100.00	0.00	0.00	0.00	0.00	8,100.00
		Laboratory Instruments	****6112211	59,200.00	0.00	0.00	0.00	0.00	59,200.00
		Industrial & Manufacturing Equipment	****6112212	26,000.00	0.00	0.00	0.00	0.00	26,000.00
		Construction Eqipment	****6112213	30,150.00	0.00	0.00	0.00	20,700.00	9,450.00
		Broadcasting Equipment	****6112214	814,990.00	107,100.00	0.00	0.00	0.00	922,090.00
		Defence Equipment	****6112215	4,000.00	0.00	0.00	0.00	0.00	4,000.00
		Agricultural &	****6112216	40,920.00	25,252.00	0.00	0.00	0.00	66,172.00

		Dairy Farm Equipment						
		Fire Protection Equipment	****6112217	0.00	4,500.00	0.00	0.00	0.00	4,500.00
9153-->	4.1-Land		61410	188,729,000.00	1,290,880,000.00	0.00	0.00	0.00	1,479,609,000.00
		Land	****614100	188,729,000.00	1,290,880,000.00	0.00	0.00	0.00	1,479,609,000.00

REMARKS

This is a computer-generated document. No signature is required.

-

Report Generated by the new CIGAS Web Application--Developed by S.Tharshan - Director, Dept of State Accounts

Print

		˥ ∨ ˥-7
⁼Ş ⁚ ⁚ Ł ɹ ε ←ı ι ⁊		
⁻ ˈ ˛ ˈ ⊂ ɹ Z ǯ : Ò ˛dzκ ⁻ ɖ ← ɹ ←ı ⁊ ⊂ ⁊ ⁼ ɹ ˛ ⁚		
⁻ ˛ ⁚ Q̄ ” ⁊ ˈ ⁚ විසින්, ˛ ˛ ˈ ⊂ ←⁺ ˇ ” ⁊ ˈ ⁚ ⁊ වෙනුවෙන් එකතු කරන ලද ආදායම	-	
⁼ ⁚ Ļ Q̄ ˛ ⊂ වෙනුවෙන් ˛ ˛ ˈ ⊂ ←⁺ ˇ ” ⁊ ˈ ⁚ ⁊ විසින් දරන ලද වියදම්	3,555,365,455	
⁼ ⁚ Ļ Q̄ ˛ ⊂ ⁻ ˛ ȧ ⁻ ˛ Z ˛ ˛ ˈ ⊂ ←⁺ ˇ ” ⁊ ˈ ⁚ ⁊ ʨ^Z ⁼Q̄ ǭ ←ı ⁺ ɹ “ ι” ŗ ə ˛ ⁻ ˛ ȧ ⁻ ˛ Z ←⁺ ⁚ ⁻ ˈ ∘ ⁺ Ĺ ɞɹ	21,350,692	
⁼ ⁚ Ļ Q̄ ˛ ⊂ ʨ^Z ⁼Q̄ ǭ ←ı ⁺ ɹ “ ι” ŗ ə ˛ ˇ ←⁺ ⁚ ⁻ ˈ ˥ ⁻ Ĺ ɞɹ	5,738,250	3,582,454,397
⁼Nj ←, ˛ :		
⁼ ⁚ Ļ Q̄ ” ˈ ˛ ⁊ ɹ ˛ ⊂ වෙනුවෙන්, ˛ ˛ ˈ ⊂ ←⁺ ˇ ” ⁊ ˈ ⁚ ⁊ විසින් එකතු කරන ලද ආදායම්	318,688,155	
⁻ ˛ ⁚ Q̄ ” ⁊ ˈ ⁚ විසින්, ˛ ˛ ˈ ⊂ ←⁺ ˇ ” ⁊ ˈ ⁚ ⁊ වෙනුවෙන් දරන ලද වියදම්	62,065	
⁼ ⁚ Ļ Q̄ ˛ ⊂ ⁻ ˛ ȧ ⁻ ˛ Z ˛ ˛ ˈ ⊂ ←⁺ ˇ ” ⁊ ˈ ⁚ ⁊ ʨ^Z ⁼Q̄ ǭ ←ı ⁺ ɹ “ ι” ŗ ə ˛ ⁻ ˛ ȧ ⁻ ˛ Z ←⁺ ⁚ ⁻ ˈ ˥ ⁻ Ĺ ɞɹ	23,351,182	
⁼ ⁚ Ļ Q̄ ˛ ⊂ ʨ^Z ⁼Q̄ ǭ ←ı ⁺ ɹ “ ι” ŗ ə ˛ ˇ ←⁺ ⁚ ⁻ ˈ ∘ ⁺ Ĺ ɞɹ	810,358	342,911,760
2021 ⁻ ˈ ⁚ ⁻ ɹ ˥ ⊂ **31** Ò ˇ ⁼Ş ⁚ ⁚ Ł ɹ ε ←ı ι ⁊		**3,239,542,636**
* ∘ ˈ ⁚ ⁄ ∘ Z ⁼ʎ ˛ ˛ ⁻ ˇ ⁼ ˈ ⁺ ˛ ⁼ ˛ ˛ ˛ ⁼ʎ ˛ ⁊ Z´ ⁻ ɖɹ ←, ∘ ⁻ ←.		

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

ආදයම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
10.03.07.02	රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවට අදාළ ලියාපදිංචි ගාස්තු	20,000,000.00	20,000,000.00	22,117,131.67	110.59
10.03.07.03	වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ආදායම	-	-	305,789.01	-
10.03.07.05	ආරක්ෂක අමාත්‍යාංශයට අයත් බලපත්‍ර ගාස්තු	250,000.00	250,000.00	264,210.00	105.68
10.03.07.99	වෙනත් (ස්වදේශ කටයුතු අමාත්‍යාංශය සඳහා)	9,500,000.00	6,000,000.00	4,315,398.01	71.92
20.02.01.01	රජයේ ගොඩනැගිලි සහ නිවාස කුලියට දීම	3,500,000.00	3,000,000.00	2,872,510.87	95.75
20.02.01.03	ඉඩම් ආදායම් හා වෙනත් ආදායම්	30,000,000.00	30,000,000.00	34,600,098.30	115.33
20.02.02.99	පොලී සහ වෙනත්	1,210,000.00	12,100,000.00	10,892,611.21	90.02
20.03.01.00	දෙපාර්තමේන්තු විකුණුම්	-	-	5,250.00	-
20.03.02.13	විභාග සහ වෙනත් ගාස්තු	-	-	202,645.00	-
20.03.02.14	මෝටර් රථවාහන පනත සහ වෙනත් කුවිතාන්සි යටතේ ගාස්තු	-	-	70,515,502.00	-
20.03.02.03	පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ ගාස්තු	-	-	4,883,950.40	-
20.03.02.99	විවිධ භාණ්ඩ	3,400,000.00	2,000,000.00	917,595.49	45.88
20.03.07.00	වී අලෙවිය	-	-	82,514,887.20	-
20.03.99.00	වෙනත් කුවිතාන්සි	19,000,000.00	19,000,000.00	16,224,182.36	85.39
20.04.01.00	මධ්‍යම රජයේ ආදායම්	-	-	69,373,938.79	-

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තථ්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
1	බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශ	101-2-6-7-2205 නිරසර පුන්‍යග්‍රාම වැඩසටහන 2019/2021 හා ඌන සංවර්ධිත දහම්පාසල් සංවර්ධනය කිරීමේ වැඩසටහන - 2021		5,040,000.00	2,764,690.41	54.85
		101-2-6-8-2205 අයහපත් කාලගුණයෙන් ආපදාවට පත් විහාරස්ථාන ප්‍රතිසංස්කරණය - 2021 හා ඌන සංවර්ධිත විහාරස්ථාන වැඩිදියුණු කිරීමේ වැඩසටහන - 2021		8,990,000.00	6,879,927.36	76.53
		101-02-05-23-2104 සංස්කෘතික මධ්‍යස්ථානයේ ඉතිරි වැඩ නිම කිරීම (මහඔය/ උහන/ඉරක්කාමම්/ සායින්දමරුදු / දමන)		40,480,316.33	13,615,140.33	33.63
		101-2-6-9-2205 නිරසර පුන්‍යග්‍රාම වැඩසටහන		876,000.00	869,749.40	99.29
		101-2-5-0-2001 සංස්කෘතික මධ්‍යස්ථානය - පදියතලාව/ දෙහිඅත්තකණ්ඩිය		442,806.65	420,433.97	94.95
2	මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව	202-2-1-7-2506 මුස්ලිම් සංස්කෘතික මධ්‍යස්ථාන ඉදිකිරීම හා පල්ලි වැඩිදියුණු කිරීම සංවර්ධන වැඩසටහන 2021 (පොතුවිල්, ඉරක්කාමම්, කාර්නිව්)		990,000.00	973,297.70	98.31

3	ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව	203-02-01-10-2205 මහවැලි මාතා සිද්ධස්ථානය ප්‍රතිසංස්කරණය කිරීම හා පාතිමාවේ අප ස්වාමිදුවගේ සිද්ධාස්ථානයේ අල්නාරය ඉදිකිරීම		1,784,000.00	1,690,607.36	94.76
4	අධිකරණ අමාත්‍යාංශය	228-1-1-0-2001 අධිකරණවල සුළු අලුත්වැඩියා හා කුඩා පරිමාණයේ ඉදිකිරීම් කටයුතු සඳහා ප්‍රතිපාදන නිදහස් කිරීම		7,330,692.63	77,844.38	1.06
5	වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව	284-1-1-8-2105 අලිවැට ඉදිකිරීම සහ අලිවැට ශුද්ධ කිරීම		56,232,999.37	20,388,866.47	36.26
6	වේවැල් පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය	408-02-03-01-2509 විදාතා මධ්‍යස්ථානය ප්‍රතිසංස්කරණය		2,806,340.00	2,569,456.93	91.56
		408-02-03-08-2509 (1) එක් ගමකට එක් ව්‍යවසායකයෙක් බිහිකිරීමේ වැඩසටහන		41,748,276.79	21,157,275.03	50.68
		408-02-03-08-2509 (2) ග්‍රාමීය කර්මාන්ත සඳහා දේශීය හා විදේශීය වෙළඳපළ ප්‍රවර්ෂන වැඩසටහන		1,163,133.10	1,060,663.10	91.19
		408-02-03-08-2509 (3) ග්‍රාමීය හා සාම්ප්‍රදායික කර්මාන්ත ගම්මාන ඒකාබද්ධ සංවර්ධන වැඩසටහන		11,007,361.75	2,790,064.50	25.35
7	ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පි ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය	401-2-03-020-1409 හෙනානිගල දකුණ ආදිවාසී කෞතුකාගාර ඉඩම වටා සවිකර ඇති කම්බි වැට ඉවත් කර දැල් සවි කිරීම හා පවතින ගේට්ටුව ආරක්ෂිත අයුරින් සවි කිරීම සහ කෞතුකාගාර පරිශ්‍රයේ පිහිටි නිවාස දෙකක වහලය ප්‍රතිසංස්කරණය කිරීම.		2,268,855.75	589,181.34	25.97

8	රාජ්‍ය ආරක්ෂණ හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය	409-02-09-02-2509 ආපදා අවම කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම (මහඔය, අඩ්ඩාලච්චේන, උහන)		11,922,115.00	3,388,112.69	28.42
9	දහම්පාසල් පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය	422-02-03-03-2001 ගොඩනැගිලි හා ඉදිකිරීම		1,850,058.00	1,337,497.58	72.29
		422-01-02-01-2205 (11) දහම්පාසල් කටයුතු සංවර්ධනය ශ්‍රී ඥානතිස්ස දහම් පාසල, ශ්‍රී වජිරාරාම විහාරය, අංක 18, වීරගොඩ උහන, අම්පාර		475,013.00	-	-
10	ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජල සම්පාදන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය	433-02-03-5-2506 (11) ග්‍රාමීය ජල සම්පාදන හා ඝනීපාරක්ෂාව වැඩිදියුණු කිරීම.		3,250,000.00	-	-
11	කෘෂිකර්ම දෙපාර්තමේන්තුව	285-02-03-0-2104අම්පාර නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (අන්තර් පළාත්) රැස්වීම් ශාලාව ඇතුළු කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීමට අදාළ බිල්පත් නිරවුල් කිරීම සඳහා		4,130,619.00	3,824,646.49	92.59
		285-02-03-0-2001අම්පාර නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (අන්තර් පළාත්) රැස්වීම් ශාලාව ඇතුළු කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම		2,794,287.48	2,603,801.12	93.18
12	ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව	290-01-01-0-2001 පොතුවිල් සහ උල්ල ධීවර පරීක්ෂක කාර්යාල අළුත්වැඩියා කිරීම		253,545.97	240,435.30	94.83

3.8 **මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය**

රු. 000

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2021 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2021 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	1,222,861,770.84	1,222,861,770.84	-	100%
9152	යන්ත්‍රෝපකරණ	661,191,395.59	661,191,395.59	-	100%
9153	ඉඩම්	1,479,609,000.00	1,479,609,000.00	-	100%
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-	-	
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	
9160	කෙරීගෙන යන වැඩ	59,758,515.56	59,758,515.56	-	100%
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

AMP/A/Dist.Sec/SR/2021 2022 ජූනි/ජූලි දින.

දිස්ත්‍රික් ලේකම්
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
අම්පාර.

අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව

ඉහත සඳහන් වාර්තාව මේ සමග යවනු ලැබේ.

ඊ.කේ.කේ.එස්. එදිරිසිංහ
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

AMP/A/Dist.Sec/SR/2021 2022 ජූනි දින.

දිස්ත්‍රික් ලේකම්
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
අම්පාර.

අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 **තත්ත්වාගණනය කළ මතය**

අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අම්පාර දිස්ත්‍රික් ලේකම් කර්යාලය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2021 නොවැම්බර් 26 දිනැති අංක 2021/03 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමිපාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ¶ ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- ¶ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- ¶ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පැදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- ¶ මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වී නිබු බවත්,

(ආ) පසුගිය වර්ෂයේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ වාර්තාවෙන් පෙන්වා දෙන ලද නිර්දේශ ක්‍රියාත්මක කර නිබුණි.

1.6 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

1.6.1 මූල්‍ය නොවන වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් වටිනාකම තක්සේරු කර නිබූ ජංගම නොවන වත්කම්වල දමන, අක්කරෙයිපත්තු සහ නින්දවූර් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අදාල ගොඩනැගිලිවල එකතුව රු.73,662,621කින් අඩුවෙන් සහ එසේම, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ආලෙයිඅඩිවේම්බු, ඉරක්කාමම් සහ නාවිදන්වෙලි ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අයත් ගොඩනැගිලිවල වටිනාකම එකතුව රු.181,052,927කින් වැඩියෙනුත් සඳහන් කර මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර නිබුණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් සමාලෝචිත වර්ෂයේ ජංගම නොවන වත්කම්වල වටිනාකම රු.107,390,306කින් වැඩියෙන් දක්වා නිබුණි.

(ආ) ඉරක්කාමම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අළුතින් ඉදිකළ වැසිකිලිය සඳහා රු.686,138ක් මූලධන වැය විෂය අංක 270-1-1-0-2001යටතේ නොදක්වා පුනරාවර්තන වැය විෂය අංක 270-1-1-0-1303 යටතේ ඇතුළත් කර නිබුණි. මෙහි ප්‍රතිඵලයක් ගොඩනැගිලි අළුත්වැඩියා වියදම් වැඩියෙන් දක්වා ඇති අතර එලෙසම ගොඩනැගිලි පුනරුත්ථාපන වියදම් අඩුවෙන් දක්වා නිබුණි.

1.6.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව, සේවය අත්හිටුවූ, සේවය අත්හැරගිය, මියගිය සහ විශ්‍රාම ගිය නිලධාරීන් 08කගෙන් සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විටත් මාස 03සිට වර්ෂ 03ක කාල පරාසයක් හිඟහිටිව පැවැති රු.1,546,553ක් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

1.6.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

සමාලෝචිත වර්ෂය සඳහා ජංගම නොවන වත්කම් ප්‍රකාශයේ (**ACA –** 6) හි දක්වා තිබූ වර්ග 16ක වත්කම්වල ආරම්භක ශේෂ රු.1,164,432,256ක් වූවත්, පසුගිය වර්ෂයේ අවසාන ශේෂය ලෙස රු. 1,204,371,729ක් ලෙස පැවැතුණි. මේ අනුව, මෙම නොසැසඳීම සඳහා වූ සැසඳුම් ප්‍රකාශය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

1.6.4 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත සඳහන් ලේඛන පවත්වා නොතිබුණි.

ලේඛන වර්ගය	අදාල රෙගුලාසිය	නිරීක්ෂණ
හානි හා පාඩු ලේඛනය	**110**	යාවත්කාලීන කර පවත්වා නොතිබුණි.
බැරකම් පිළිබඳ ලේඛනය	**214**	යාවත්කාලීන කර පවත්වා නොතිබුණි.
විදුලි උපකරණ ලේඛනය	**454(2)**	පවත්වා නොතිබුණි.
ඇප තැබිය යුතු නිලධාරීන්ගේ ඇප ලේඛනය	**891(1)**	යාවත්කාලීන කර පවත්වා නොතිබුණි.
රජයේ ප්‍රසම්පාදන කමිටුවේ ලේකම්වරයා විසින් නඩත්තු කරන පැමිණීමේ ලේඛනය	**2.11.2**	පවත්වා නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 අග්‍රිම කළමනාකරණය

සමාලෝචිත වර්ෂය අවසානයේ ලැයිස්තු සඳහා ගෙවීම් සිදුකිරීම සඳහා රු. 648,748,967ක අග්‍රිම ඉල්ලුම් කර තිබුණත්, රු.453,936,880ක් පමණක් සමාලෝචිත වර්ෂය අවසාන දින වන විට ලැබී තිබුණි. ඒ අනුව, ඉල්ලුම් කළ අග්‍රිම රු.194,812,087ක් නොලැබීම හේතුවෙන් පාර්ලිමේන්තුවෙන් සලසා තිබූ මූල්‍ය ප්‍රතිපාදන උපයෝජනය කිරීමටත් සැලැසුම් කළ ව්‍යාපෘති නියමිත කාලය තුළ අවසන් කිරීමටත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට නොහැකිවී තිබුණි.

2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා පරිපූරක ඇස්තමේන්තු රු. මිලියන 100ක් කාබනික පොහොර නිෂ්පාදනය සඳහා වැය විෂය අංක 270-1-1-7-2509 යටතේ 2021 සැප්තැම්බර් 29 දින ලැබී තිබුණත්, මෙම ප්‍රතිපාදනය උඵයෝජනය කිරීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ක්‍රියාමාර්ග නොගැනීම හේතුවෙන් සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරියක් ලෙස ගිණුම්වල දක්වා තිබුණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් කාබනික පොහොර නිෂ්පාදන ව්‍යාපෘතියේ අරමුණු ළඟාකර ගෙන නොතිබුණි.

(ආ) විෂයයන් 05ක් සඳහා පුනරාවර්තන වියදම් සහ විෂයයන් 04ක් සඳහා මූලධන වියදම් සඳහා එකතුව රු. 148,476,069ක් ප්‍රතිපාදන සලසා තිබූ නමුත් සමාලෝචිත වර්ෂයේ 72,822,446ක් පමණක් වැය කර තිබීම හේතුවෙන් රු. 75,653,624ක් ඉතිරි වී පැවැතුණි. මෙම ඉතිරිය මුළු වියදම් ප්‍රතිපාදනයෙන් සියයට 10ක සිට සියයට 58ක් දක්වා පරාසයක පැවැතුණි

2.3 වෙනත් අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය කිරීම

අමාත්‍යාංශ 37ක් සහ දෙපාර්තමේන්තු 23කින් සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු. මිලියන 5,275ක ප්‍රතිපාදන ලැබී තිබුණි. මෙම ප්‍රතිපාදනවලින් සමාලෝචිත වර්ෂය අවසාන වන විට එකතුව රු. මිලියන 3,531ක් උපයෝජනය කර තිබුණි. මේ අනුව රු. මිලියන 1,745ක් ඉතිරි වී පැවැතුණි. මේ හේතුවෙන් අදාල අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් අපේක්ෂා කළ ව්‍යාපෘති නියමිත පරිදි ක්‍රියාත්මක කර නොතිබුණි.

2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි පරීක්ෂාවේදි නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීමේ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(m) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය**	
(i) VIII **පරිච්ඡේදයේ** 3:5 **වගන්තිය**	කාරෙයිතීවු සහ අක්කරෙයිපත්තු ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල අනුමත සේවක සංඛ්‍යාවට වඩා වැඩියෙන් කළමනාකරණ සේවා නිලධාරීන් 10ක් සහ සංවර්ධන නිලධාරීන් 66ක් සිටි නමුත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල කළමනාකරණය විසින් අදාල අභ්‍යන්තර කාර්ය සැලැස්ම සකස් කර අනිකාල දීමනා අවම කර ගැනීම සඳහා ක්‍රියාමාර්ග නොගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ රු.2,280,614ක් නිලධාරීන් 49කට අනිකාල දීමනා ගෙවීම් සිදුකර තිබුණි.
(ii) XIX **පරිච්ඡේදයේ** 5 **සහ** 5:1 **වගන්ති**	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් රජයේ නිවාස 16ක පදිංචිව සිටින පදිංචිකරුවන්ගෙන් 2020 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා හිඟකුලි එකතුව රු. 355,782ක් අයකර ගැනීමට පියවර නොතිබුණි. මේ හේතුවෙන් රජයට ලැබිය යුතු කුලි ආදායම් අදාල වටිනාකමින් අඩුවී තිබුණි.
(iii) **XIX** පරිච්ඡේදයේ **6.2** වගන්තිය	රජයේ නිලධාරියෙකුට පමණක් රජයේ නිවාසයක් වෙන්කර දිය යුතු බව සඳහන් වුවත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පිටස්තර පුද්ගලයින් 03කට මාසික කුලි පදනමින් රජයේ නිවාස වර්ෂ 02 සිට 24ක් දක්වා කාලයක් ලබාදී තිබු අතර ඉන් එක් රජයේ නිවාසයක හිඟ කුලි රු.5,500ක් අයකර නොමැතිව පැවැතුණි. තවද, රජයේ නිලධාරීන් 115ක් පොරොත්තු ලේඛනයේ

		ඇතුළත් කර තිබුණි. මේ අනුව අදාල රජයේ නිවාස ආපසු ලබාගෙන පොරොන්තු ලේඛනයේ සිටින නිලධාරීන්ට ප්‍රමුඛතා පදනමින් ලබාදීමට ඵලදායී ක්‍රියාමාර්ග දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ගෙන නොතිබුණි.
(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයට;	

	(i) මුදල් රෙගුලාසි 137 (5) සහ 138(4)	සැපයුම් භාණ්ඩ සඳහා ගෙවීම් කිරීමේදි භාණ්ඩ නිවැරදිව පරීක්ෂා කර භාර ගෙන වියදම අනුමත කර සහතික කර ගෙවීම් සිදුකළ යුතුවේ. නමුත්, ආලෙයඩිවේම්බු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සමෘද්ධි වැඩසටහන යටතේ ප්‍රතිලාභීන්ට ලබාදිය යුතු රු.8,080,557ක් වටිනා ද්‍රව්‍ය ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ලැබී නොතිබියදීත් ඒ සඳහා වියදම් සහතික කර චෙක්පත් ලියා තිබුණි.
	(ii) මුදල් රෙගුලාසි 261 (3)	ප්‍රමාණවත් මුදල් නොමැති විටෙකදී මුදල් පොතේ ගෙවීම් ඇතුළත් නොකළ යුතු හෝ චෙක්පත් ගෙවීම් සඳහා ද නොලිවිය යුතු බවට සඳහන් වුවත්, සායින්ද මරුදු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.4,869,983ක් වටිනා චෙක්පත් 08ක් ලියා තිබුණි.
	(iii) මුදල් රෙගුලාසි 447	දෙපාර්තමේන්තුවක ප්‍රධානියෙකු වියදම් පාලනය කිරීමේ අපේක්ෂාවෙන් වියදම් කිරීම සඳහා ලැබිමට අපේක්ෂිත නිවැරදි වටිනාකම දැනගැනීම මගින් (වැය ලෙජරය) ප්‍රතිපාදන ලෙජරයක් පවත්වා ගත යුතුවේ. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වැඩසටහන්; Iහි පුනරාවර්තන සහ විවිධ වියදම් විෂයන් 13ක එකතුව රු. 374,866,533ක් සඳහා සටහන් වැය ලෙජරයේ ඇතුළත් කර නොතිබුණි.
(ඇ)	2020 ඔක්තෝබර් 02 දිනැති අංක 05/2020 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් භාවිතයට ගත නොහැකි ඉවත් කළ යුතු වාහන 19ක් සම්බන්ධයෙන් වර්ෂ 02 සිට 15ක් දක්වා කාලයක් සුදුසු පියවර ගෙන නොතිබුණි.
(ඈ)	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ – 2006 පසු ඇමුණුම් - 35	ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවේ (RPC) භාණ්ඩ හා සේවා සඳහා ප්‍රසම්පාදන සීමාව රු. මිලියන 01ක් වුවද, රු. 2,175,000ක් වටිනාකමට උඳු පොතු ඉවත් කිරීමේ යන්ත්‍රය (Black Gram Skin Removing Machine), තිරුක්කෝවිල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සහ රු.3,702,000ක්වටිනා දුමෙන් වියලීමේ නිෂ්පාදන යන්ත්‍ර දමන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින්ද ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටු සීමාව (RPC) ඉක්මවා තීරණ ගෙන මිලදී ගැනීම් සිදුකර තිබුණි.

2.5 කොන්ත්‍රාත් සම්බන්ධ බදු අයකිරීම්

2020 වර්ෂයේ කොන්ත්‍රාත් කාර්යයන් දෙකකින් අඩුකළ එකතු කළ අගය මත බදු රු.929,318ක් නියමිත කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීම් සිදුකර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට යැවීමට පියවර ගෙන නොතිබුණි. මෙහි ප්‍රතිඵලයෙන් රජයට ලැබිය යුතු ආදායම් එම වටිනාකමින් අඩුවී දැක්වුණි.

2.6 අවිධිමත් ගනුදෙනු

නාවිදන්වෙලි ප්‍රාදේශීය ලේකම් කාර්යාල බලප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්වරයා වෙනුවෙන් වෙන් කළ රජයේ නිවාසයක් පැවැතුණද, මෙම නිවාසය අළුත්වැඩියා කර පදිංචිවීමට පියවර නොගෙන ප්‍රාදේශීය ලේකම්වරයා සහ සහකාර ප්‍රාදේශීය ලේකම්වරයා වෙනත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල බලප්‍රදේශවල ජීවත්වීම සඳහා සමාලෝචිත වර්ෂයේ නිවාස කුලී ලෙස එකතුව රු.324,000ක් ගෙවීම් සිදුකර තිබුණි.

2.7 තැන්පතු

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 09ක් විසින් රැස්කළ වාහන දඩ ගාස්තු රු. 1,063,940ක් නියමිත දෙපාර්තමේන්තුවට යැවීමට පියවර නොගෙන තැන්පතු ගිණුමේ රඳවා තබා තිබුණි.

2.8 වැඩියෙන් අයකිරීම්

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

දමන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් වටිනාගල මාර්ගයේ එක් කොටසක කිලෝමීටර් 22ක දුරක් අලි වැට ඉදිකිරීම සඳහා මාර්ගය එලිපෙහෙලි කිරීමේ කාර්යයට රු.1,783,066ක් වනජීවී දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේ ප්‍රතිපාදන සලසා තිබුණි. නමුත් මෙම කාර්යය සම්බන්ධයෙන් මහජනතාවගේ ඉල්ලීමට එකඟව 2021 ජූනි 30 දින අත්හිටුවා තිබූ අතර කිලෝමීටර 15ක දුරක කාර්යයන් සඳහා රු.1,315,645ක් කොන්ත්‍රාත්කරුට 2021 අගෝස්තු 24 දින ගෙවීම් සිදුකර තිබුණි. කෙසේ වෙතත්, වනජීවී දෙපාර්තමේන්තු නිලධාරී විසින් 2021 නොවැම්බර් 24 දින ඉදිරිපත් කළ වාර්තාව ප්‍රකාරව කිලෝමීටර 09ක දුරකට පමණක් කාර්යයන් ඉටුකර තිබුණි. එසේ වුවත්, සිදුනොකළ කිලෝමීටර 06ක දුර සඳහා රු.526,259ක් ගෙවීම් සිදුකර තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නින්දවූර් ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ග්‍රාමසේවා වසම් දෙකක සෞභාග්‍යා වැඩසටහන යටතේ රු.600,000ක් වටිනා කුකුල් පැටව් 1800ක් ප්‍රතිලාභීන් 60කට ලබාදී තිබුණත්, සියයට 24ක් හෙවත් රු.282,000ක් වටිනා කුකුල් පැටව් 430ක් ලබාදී මාස 03ක් ඇතුළත මියයාම නිසා අපේක්ෂිත ප්‍රතිලාභ ප්‍රතිලාභීන්ට ලබාගත නොහැකි වී තිබුණි.

(ආ) පරිසර අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රතිපාදන යටතේ ගංඉවුරුවල උණ ගස් පළතුරු පැල සිටුවීම සඳහා රු. 416,500ක් ඉරක්කාමම් සහ නින්දවූර් ප්‍රාදේශිය ලේකම් කාර්යාලවලට සමාලෝචිත වර්ෂයේ ලබාදී තිබුණි. නමුත්, පරිසර අධිකාරියෙන් ලැබී තිබූ උණ පැල 3000න් සහ මිලදී ගත් පළතුරු පැල 400න් සියයට 75කට අධික පැල සංඛ්‍යාවක් මියගොස් තිබීම හේතුවෙන් අපේක්ෂිත ප්‍රතිලාභ ලබාගත නොහැකිවී තිබුණි.

3.1.2 ව්‍යාපෘති සම්පූර්ණ නොකර අත්හැර දැමීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නැගෙනහිර පළාත් කෘෂිකර්ම, වාරිමාර්ග, පශුසම්පත් නිෂ්පාදන, සංවර්ධන, ධීවර සමූපකාර සංවර්ධන සහ ආහාර සැපයීම සහ බෙදාහැරීමේ අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රතිපාදන යටතේ කාබනික පොහොර නිෂ්පාදනය සඳහා යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම සඳහා රු.200,000ක් කල්මුනේ, ඉරක්කාමම් සහ දමන ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා සමාලෝචිත වර්ෂයේ ලබාදී තිබූ නමුත් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට ක්‍රියාත්මක කිරීමට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) උහන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් චන්දනනාද සමය විහාරයේ දාන ශාලාව ඉදිකිරීම සඳහා බුද්ධශාසන, සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍යාංශය විසින් 2021 වර්ෂයේ රු.500,000ක මූල්‍ය ප්‍රතිපාදන සලසා තිබූ නමුත්, තෝරා ගත් ඉඩමට ගමන් කිරීමට සුදුසු මාර්ගයක් නොමැතිවීම සහ මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම වැනි හේතු නිසා මෙම ව්‍යාපෘතිය අත්හැර දමා තිබුණි.

(ඇ) උහන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සංශෝධිත විමධ්‍යගත අයවැය යටතේ ව්‍යාපෘති 04ක් සඳහා වෙන්කළ රු.500,000ක් වටිනා කාර්යයන් සඳහා ප්‍රාදේශීය ලේකම්වරයා සමග ගිවිසුම්ගත වී තිබුණත් ප්‍රමාණවත් කාලයක් නොමැතිවීම සහ කොන්ත්‍රාත් කරු නියමිත කාලයේදී කාර්යයන් ආරම්භ නොකිරීම වැනි හේතු නිසා මෙම ව්‍යාපෘති අත්හැර දමා තිබුණි.

(ඈ) ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන කාර්යාංශය (ONUR) විසින් රු.750,000ක් මීමැසි ඇතිකිරීමේ ව්‍යාපෘතිය සඳහා දමන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට 2019 වර්ෂයේ ලබාදී තිබූ නමුත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.343,125ක් පමණක් මීමැසි කූඩු සැකසීම සඳහා වැයකර තිබූ අතර මීමැසි නොමැතිවීම හේතුවෙන් මෙම ව්‍යාපෘතිය අත්හැර දමා ඉතිරි මුදල වන රු.368,000ක් තැන්පතු ගිණුමේ රඳවා තබා තිබුණි.

3.1.3 ව්‍යාපෘති නිමකිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආලෙයියඩිවේම්බු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය විසින් අවතැන්වූ ප්‍රතිලාභීන් 55කට නිවාස ලබාදීම සඳහා රු.55,000,000ක ප්‍රතිපාදන සලසා තිබුණි. නමුත්, 2021 අගෝස්තු 12 දිනැති අංක PLN/DEVE/RESET/HOIMN/29 දරන නිවාස ඉදිකිරීමේ ගිවිසුම් ප්‍රකාරව අදාල ව්‍යාපෘතිය ගිවිසුම් අත්සන් කර මාස 05කින් අවසන් කළයුතු බවට සඳහන් කර තිබුණත් නිවාස 50ක් සම්පූර්ණයෙන් නිම නොකර සහ මේ දක්වා එක් නිවසක ඉදිකිරීම් කටයුතු ආරම්භ නොකරත් පැවැතුණි.

(ආ) උහන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සෞභාග්‍ය වැඩසටහන යටතේ කහ නිෂ්පාදන මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා රු.1,779,771ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් වැය කර තිබූ නමුත් මෙම කාර්යය 2021 දෙසැම්බර් 31 දින අවසන් විය යුතු බව ගිවිසුමේ සඳහන් වුවත්, මෙම ගොඩනැගිලි ඉදිකිරීමේ කාර්යය 2022 මැයි 09 දින වන විටත් සම්පූර්ණ කර නොතිබුණි.

(ඇ) උහන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් "ගම සමග පිළිසඳර" වැඩසටහන යටතේ රජයේ සේවාවන් එකම ස්ථානයකින් ඉටුකරවා ගැනීමේ ගොඩනැගිලි ඉදිකිරීම සඳහා රු.3,326,585කින් කොන්ත්‍රාත් කරුවෙකුට ලබාදී තිබූ නමුත් මෙම කාර්යය 2022 මැයි 09 දින වන විටත් සම්පූර්ණ කර නොතිබුණි.

(ඈ) සමෘද්ධි ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා සහ ව්‍යාපාර සංවර්ධන රජාඋ අමාත්‍යාංශය විසින් දමන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කළුගොල්ල ගම්මානයේ මත්ස්‍ය නිෂ්පාදනය සඳහා මසුන් අභිජනන ජල තටාක 30ක් ඉදිකිරීම සඳහා රු.2,667,600ක් සමාලෝචිත වර්ෂයේ සලසා තිබුණි. එනමුත් මෙම ව්‍යාපෘතිය 2021 දෙසැම්බර් 31 දින අවසන් විය යුතු පව දිස්ත්‍රික් කාර්යාලය විසින් සඳහන් කර තිබුණත් මසුන් අභිජනන ජල තටාක 17ක් මේ දක්වා ඉදිකර නොතිබුණි.

(ඉ) සමෘද්ධි ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා සහ ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය විසින් දමන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කරවල නිෂ්පාදනය සඳහා දුමෙන් වියලීමේ යන්ත්‍ර 30ක් මිලදී ගැනීම සඳහා රු.3,902,000ක් ප්‍රතිපාදන සලසා තිබුණි. නමුත්, ගිවිසුම් ප්‍රකාරව මෙම ව්‍යාපෘතිය 2021 දෙසැම්බර් 25 දිනය ඇතුළත අවසන් විය යුතු බව සඳහන් වුවත් මේ දක්වා වියලි දුම් යන්ත්‍ර 27ක් මිලදීගෙන නොතිබුණි.

3.1.4 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති;

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) තිරුක්කෝවිල් ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට සෞභාග්‍ය වැඩසටහන යටතේ රු.2,175,000කට උඳු පොතු ඉවත් කිරීමේ යන්ත්‍ර (Black Gram Removing Machine) 2021 දෙසැම්බර් 31 දින මිලදීගෙන තිබුණත් අදාල යන්ත්‍රවල ක්‍රියාකාරිත්වය පිළිබඳව ප්‍රමාණවත් දැනුවත් වීමක් සංගමයේ සාමාජිකයන් සතුව නොතිබීම හේතුවෙන් මේ දක්වා මෙම යන්ත්‍ර භාවිතා කර නොතිබුණි.

(ආ) නින්දවූර් ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට සෞභාග්‍ය වැඩසටහන යටතේ ප්‍රතිලාභීන් 148ක ලබාදීම සඳහා රු.30,000ක් බැගින් කුකුල් පැටව් 60ක් උත්පාදන යන්ත්‍ර (Incubator Machine) රු.180,000කට 2021 දෙසැම්බර් 23 දින මිලදීගෙන තිබූ නමුත් ප්‍රතිලාභීන්ට මෙම යන්ත්‍ර ක්‍රියාකාරිත්වය පිළිබඳව පුහුණුවක් නොමැති වීම හේතුවෙන් මේ දක්වා නිෂ්කාර්යව පැවැතුණි

(ඇ) සමෘද්ධි ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා සහ ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය විසින් ආලෙයිඩ්වේම්බු සහ ඉරක්කාමම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිෂ්පාදන ගම්මාන ස්ථාපිත කර ජනතාවගේ ජීවනෝපාය නැංවීම සඳහා වූ වැඩසටහන යටතේ එළුවන් මිලදී ගැනීම, පට්ටි ඉදිකිරීම්, රක්ෂණ සහ පුහුණුව ලබාදීම සඳහා එකතුව රු.11,955,340ක් මූල්‍ය ප්‍රතිපාදන සලසා තිබුණි. එනමුත්, එළුවන්ගේ අභිමිවීම් වෙනුවෙන් රක්ෂණය සිදුනොකිරීම නිසා ප්‍රතිලාභීන්ට ලබාදුන් එකතුව රු.580,800ක් වටිනා එළුවන් 294කින් 46ක් මාස 03ක් ඇතුළත මියගොස් තිබුණත් මෙම එළුවන් වෙනුවෙන් වන්දි ලබාගත නොහැකිවීම හේතුවෙන් අපේක්ෂිත ප්‍රතිලාභ ප්‍රතිලාභීන්ට ළඟාකර ගත නොහැකි වී තිබුණි.

(ඈ) කාරෙයිතීවු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2019 වර්ෂයේදී ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන (ONUR) යටතේ තෝරා ගනුලැබූ ප්‍රතිලාභීන් 03කට රු.445,000ක් වටිනා ධීවර බෝට්ටු (21’6” FRP Fishing Canoes) ලබාදී තිබුණි. එනමුත්, ලබාදුන් බෝට්ටු ප්‍රතිලාභීන් භාවිතයට ගෙන නොතිබූ අතර ඒවා ප්‍රතිලාභීන් විසින් වෙනත් පුද්ගලයින්ට විකිණීම නිසා ලබාදුන් අරමුණු සඳහා නියමිත කාලය තුළ ප්‍රතිලාභීන්ට අපේක්ෂිත ප්‍රතිලාභ ළඟාකර ගත නොහැකිවී තිබුණි.

3.1.5 කාල පමාවකින් පසුව වැඩ ආරම්භ කළ ව්‍යාපෘති

ඉරක්කාමම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම සහ ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය විසින් ප්‍රධාන මාර්ගයේ මංසන්ධිස්ථානයන්හි වීථි ලාම්පු සවිකිරීම සඳහා රු. මිලියන 05ක ප්‍රතිපාදන සලසා තිබුණි. නමුත්, අනුමත කළ ගිවිසුම් ප්‍රකාරව, රු.4,540,900ක් වටිනා කාර්යයන් 2021 සැප්තැම්බර් 24 දින ආරම්භ කර 2021 නොවැම්බර් 23 දින අවසන් කළ යුතුව තිබුණත්, මෙම කාර්යයන් මාස 03කට අධික කාලයක සිට ආරම්භ කර නොතිබූ අතර අදාල අමාත්‍යාංශ ලේකම් වරයාගෙන් මේ සඳහා කාලය දීර්ඝ කිරීමක්ද ලබාගෙන නොතිබුණි.

3.2 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2015, 2019 සහ 2020 වර්ෂ කාලපරිච්ඡේදයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් අංක EP PC 5228 සහ EP PD 2681 දරන වාහන අනතුරට ලක්වීම හේතුවෙන් රක්ෂණ සමාගමෙන් ලබාගත හැකිව තිබූ එකතුව රු. මිලියන 5.44ක් වාහන රක්ෂණ හිමිකම් ඉල්ලුම් කිරීම නියමිත කාලපරිච්ඡේදයේ සිදුනොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ලබාගත නොහැකිවී තිබුණි.

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් අංක 42-8880 දරන වාහනය පසුගිය වර්ෂ 21කට අධික කාලයක සිට අළුත්වැඩියා සිදුකිරීම සඳහා ගරාජයකට භාරදී තිබුණත්, එය අළුත්වැඩියා කිරීමට හෝ ආපසු ලබා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පියවර ගෙන නොතිබුණි.

(ඇ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2019 වර්ෂයේ සිට 2022 මැයි මාසය දක්වා භාවිතා කර ලබාගත් යතුරු පැදි 43ක් භාවිතා කිරීමට පියවර නොගැනීම හේතුවෙන් වර්ෂ 03කට අධික කාලයක සිට ගබඩා සංකීර්ණයේ නවතා තබා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය දක්වා දෙහිඅත්තකණ්ඩිය, පදියතලාව, මහඔය, දමන, අඩ්ඩාලච්චේන සහ තිරුක්කෝවිල් ප්‍රාදේශීය ලේකම් කාර්යාල පිහිටි ඉඩම්වල වටිනාකම් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර නොතිබුණි.

(ඉ) දෙහිඅත්තකණ්ඩිය, පදියතලාව සහ මහඔය, ප්‍රාදේශීය ලේකම් කාර්යාල පිහිටි ඉඩම්වල හිමිකාරිත්වය ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් වටිනාකම් තක්සේරු කර තිබූ දිස්ත්‍රික් ලේකම් කාර්යාල ඉඩම්වල වටිනාකම රු. 13,900,000ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර තිබුණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් සමාලෝචිත වර්ෂයේ ජංගම නොවන වත්කම්වල වටිනාකම රු.13,900,000කින් අඩුවෙන් දක්වා තිබුණි.

3.3 පාඩු හා හානි

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් සන්දානිස්සපුර ගබඩාව 2015 සැප්තැම්බර් 21 දින සොරුන් විසින් කඩා සිදුවූ පාඩුව රු.850,738ක් ලෙස තක්සේරු කර අදාල අමාත්‍යාංශයට තොරතුරු ඉදිරිපත් කර තිබුණත්, 2022 මැයි 19 දින වන විටත් ඉදිරි පියවර ගෙන නොතිබුණි.

3.4 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දීර්ඝකාලීන බදු පදනමින් ඉඩම් ලබාදීම සම්බන්ධයෙන් කල්මුනේ සහ ඉරක්කාමම් ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් අයකළ යුතු හිඟබදු එකතුව රු. 2,648,534ක් අයකර ගැනීමට පසුගිය වර්ෂ 03ක කාලයක සිට පියවර ගෙන නොතිබුණි.

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් අංක EP PA 7025 දරන වාහනය 2020 වර්ෂයේ අනතුරට ලක්වී තිබූ අතර එහි හානියේ වටිනාකම රු.1,336,098ක්ව පැවැතුණි. එසේම, අංක EP KQ 6633 දරන වාහනය 2021 වර්ෂයේ අනතුරට ලක්වී තිබුණත් එහි හානිය මේ දක්වාම තක්සේරු කර නොතිබූ අතර අනතුර සම්බන්ධයෙන් විධිමත්ව විමර්ශනයක් සිදුකර අනතුර සම්බන්ධයෙන් වගකිව යුතු අයගෙන් හෝ රක්ෂණ සමාගමෙන් වන්දි ලබාගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පියවර ගෙන නොතිබුණි.

(ඇ) සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය විසින් සාඟන්දමරුදු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට සමාලෝචිත වර්ෂයේ රු . මිලියන 2.91ක

වියදමින් අත්යන්ත්‍ර භාණ්ඩ විකිණීමේ මධ්‍යස්ථානයක් ඉදිකර තිබුණත් මේ දක්වා මෙම ගොඩනැගිල්ල භාවිතා කිරීමට පියවර ගෙන නොතිබුණි.

4. **මානව සම්පත් කළමනාකරණය**

අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2021 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 2380ක් ද, තථ්‍ය කාර්ය මණ්ඩලය 2268ක් වශයෙන් පැවැතුණ අතර කාර්ය මණ්ඩලයේ පැවැති පුරප්පාඩු 234ක් පිරවීමටත් අතිරික්ත 122ක් විධිමත්ව අනුමත කරවා ගැනීමටත් පියවර ගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ සංවර්ධන නිලධාරී කාර්ය මණ්ඩලයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07ක තනතුරු 47ක් පුරප්පාඩුවත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ තවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13ක එකී තනතුරු 167ක් අතිරික්තවත් පැවැති අතර පුරප්පාඩුව පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල මහජන සේවාවන් අඛණ්ඩව සැපයීම සඳහා අතිරික්තව සිටින සංවර්ධන නිලධාරීන්, පුරප්පාඩුව පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ස්ථාන මාරු කිරීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් පියවර ගෙන නොතිබුණි.

(ඇ) පුරප්පාඩුව පවතින ග්‍රාම නිලධාරී තනතුරු 78ක් සඳහා ස්ථිර නිලධාරීන් බඳවා නොගැනීම නිසා ග්‍රාම නිලධාරී වසම්වල පරිපාලන කටයුතු දුර්වල තත්ත්වයක පැවැතුණි.

(ඈ) 2001 අගෝස්තු 22 දිනැති අංක 18/2001 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ප්‍රකාරව, උපරිම සේවා කාලය සෑම සේවා ස්ථානයකම වර්ෂ 05ක් සේවය කර ඇති සෑම නිලධාරියෙකුම වෙනත් සේවා ස්ථානවල සේවය කිරීමට ඉඩ සැලැසීම සඳහා ස්ථාන මාරු ලබාදිය යුතු බව සඳහන් වූවත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සේවයේ නියුතු නිලධාරීන් 51ක් වර්ෂ 06 සිට 31ක් දක්වා කාලයක් එකම සේවා ස්ථානයක නියුතුව සිටියත් ඔවුන් මේ දක්වා වෙනත් සේවා ස්ථාන වෙත ස්ථාන මාරු කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

ඊ.කේ.කේ.එස්. එදිරිසිංහ
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

04. පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

නිශ්චිත දර්ශකය	අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක් (%) ලෙස සත්‍ය නිමවුම		
	100%-90%	75%-89%	50%-74%
ලබා දී ඇති ග්‍රාමීය ජල සැපයුම් සම්බන්ධතා	-	-	35.94%
ලබා දී ඇති ග්‍රාමීය ප්‍රවේශ පහසුකම්	-	-	47.67%
සපයා ඇති ආර්ථික යටිතල පහසුකම්	-	-	50.09%
ක්‍රියාත්මක කර ඇති ග්‍රාමීය ආර්ථික ක්‍රියාකාරකම්	-	-	63.66%
ක්‍රියාත්මක කර ඇති සමාජ සුබසාධන ක්‍රියාකාරකම්	-	-	57.34%
ලබා දී ඇති ග්‍රාමීය විදුලි සම්බන්ධතා	-	-	40.60%
ලබා දී ඇති ජීවනෝපාය සංවර්ධන	-	-	37.94%
ක්‍රියාත්මක කර ඇති ප්‍රජා සංවර්ධන ක්‍රියාකාරකම්	-	-	67.29%
ලබා දී ඇති සැපයුම් පහසුකම් සහ උපකරණ	-	-	60.01%
ලබා දී ඇති සනීපාරක්ෂක පහසුකම්	-	-	53.63%
පුනරුත්ථාපනය කරන ලද ආගමික මධ්‍යස්ථ	-	-	48.94%
වෙනත් යටිතල පහසුකම්	-	-	56.21%

05. පරිච්ඡේදය - තිරසාර සංවර්ධන ඉලක්ක (SDG) සාක්ෂාත් කර ගැනීම.

5.1 හඳුනාගත් අදාළ තිරසාර සංවර්ධන ඉලක්ක දක්වන්න

තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීමේ කාර්ය සාධනය						
	ඉලක්ක / අරමුණ	**ඉලක්ක**	**ජයග්‍රහණය පිළිබඳ දර්ශක**	**අද දක්වා ජයග්‍රහණවල ප්‍රගතිය**		
				0%-49%	**50%-74%**	**75%-100%**
1	සෑම දෙසකම, සෑම ආකාරයකින්ම පවතින දිළිඳු බව නිමා කිරීම	**02)** විවිධ ප්‍රභවයන්ගෙන් සම්පත් සැලකිය යුතු ලෙස බලමුලු ගැන්වීම සහතික කිරීම	**1.)** දිස්ත්‍රික්කයේ ග්‍රාමීය නිෂ්පාදන වැඩි දියුණු කිරීම සඳහා සෞභාග්‍ය නිෂ්පාදන ගම්මාන වැඩසටහනේ වටිනාකම රු. මි 79.89 කි	48.60%		
			2.) දිස්ත්‍රික්කයේ තුල ජල සම්පාදන සම්බන්ධතාවයක 39 ලබා දී ඇත			
2	සාගින්න නිමවා, ආහාර සුරක්ෂිතතාව හා ඉහළ පෝෂණ තත්වයක් සාක්ෂාත් කරගැනීම සහ තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම	**1.)** 2030 වන විට ගොවීන් ධීවරයින් සහ කුඩා පරිමාණ ආහාර නිෂ්පාදකයින්ගේ කෘෂිකාර්මික ඵලදායීතාව සහ ආදායම දෙගුණ කිරීම.	**1.)** සමහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලදු සහ මුං බීජ ලබා දී ඇත		51.95%	
			2.) කෘෂිකර්මාන්තය දියුණු කිරීම සඳහා සංවර්ධන ව්‍යාපෘති 908 ක් (ග්‍රාමීය මාර්ග, පාලම් පැති කාණු ආදිය ඇතුළත් වේ) ක්‍රියාත්මක ලදී			
3	නිරෝගිමත් ජීවිතයක් සහතිකකර, සෑම වයස් සීමාවකම සිටින සෑම අයෙකුගේම සහජීවනය ප්‍රවර්ධනය කිරීම	1.) 2030 වන විට වැළැක්වීම සහ ප්‍රතිකාර කිරීම සහ මානසික සෞඛ්‍යය සහ යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම තුළින් බෝ නොවන රෝග වලින් සිදුවන අකල් මරණ තුනෙන් එකකින් අඩු කිරීම	1.) ග්‍රාමීය ක්‍රීඩා පිටි 32ක් ප්‍රතිසංස්කරණය කර ශක්තිමත් සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් ගත කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සංවර්ධනය කර ඇත		58.00%	
		2.) 2030 වන විට සෑමට සාධාරණ සනීපාරක්ෂාව සහ සනීපාරක්ෂාව සාක්ෂාත් කර ගැනීම	1.) සනීපාරක්ෂාව සඳහා වැසිකිළි 570 ක් ඉදිකර හා ප්‍රතිසංස්කරණය කරන ලදී			

4	දැරියහැකි, විශ්වසනීය, තිරසර නව බලශක්ති සැපයුම් සහනික කිරීම	1.) 2030 වන විට දැරිය හැකි විශ්වාසනීය සහ නවීන බලශක්ති සේවාවන් සඳහා දේශීය ප්‍රවේශය සහතික කිරීම	1.) නිවාස 33ක් සඳහා විදුලි පහසුකම් ලබා දෙන ලදී	49.18%		
5	ස්ථායී යටිතල පහසුකම් ගොඩගැනීම, සංයුක්ත සහ තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය කිරීම හා නවෝත්පාදනයන් දිරි ගැන්වීම	1.) ආර්ථික සංවර්ධනයට සහාය වීම සඳහා කලාපීය සහ ට්‍රාන්ස්කෝඩර් යටිතල පහසුකම් ඇතුළුව ගුණාත්මක විශ්වාසනීය තිරසාර සහ ඔරොත්තු දෙන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම;	1.) තිරසාර කාර්මීකරණය සහ නවෝත්පාදනය පෝෂණය කිරීම සඳහා කොන්ක්‍රීට් මාර්ග, පාලම්, බෝක්කු සහ පැති කාණු සහිත ග්‍රාමීය ප්‍රෙවිශයක් සංවර්ධනය කරන ලදී.		57.10%	
		2.) කුඩා පරිමාණ කාර්මික සහ අනෙකුත් ව්‍යවසායන් සඳහා ප්‍රවේශය වැඩි කිරීම	2.) සංයුක්ත කාර්මිකකරණය ප්‍රවර්ධනය කිරීම සඳහා සති පොළ වැනි ආධාරක යටිතල පහසුකම් සංවර්ධනය කරන ලදී			

5.2 නිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න.

- ¶ ප්‍රතිපාදනය ඉදිරිපත් කිරීම මඟින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අප සකස් කරයි.

- ¶ අපගේ ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් නොවන සමහර ප්‍රතිපාදන අමාත්‍යාංශයෙන් සෘජුවම ලබා දෙනු ලැබේ.

- ¶ ප්‍රතිපාදනය නොලැබීම මත කාර්යය විනිශ්චය කළ දිනට අවසන් කිරීමට නොහැකි විය.

- ¶ අම්පාර දිස්ත්‍රික්කයේ සමහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්හි තවම පුරප්පාඩු සම්පූර්ණ කර නොමැත. සංවර්ධන නිලධාරීන් හා කාර්මික නිලධාරීන් සඳහා දෙහිඅත්තකණ්ඩිය හා පදියතලාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල බොහෝ පුරප්පාඩු පවතී.

- ¶ ග්‍රාමීය මට්ටමේ ක්ෂේත්‍ර නිලධාරීන්ට (SO, GN & EDO) තමන් භාරව සිටින ග්‍රාමයන්හි ක්‍රියාත්මක සංවර්ධන කටයුතු විශ්ලේෂණය කිරීමට හැකි තාක්ෂණ දැනුම නොමැති වීම.

- ¶ සියලු ක්ෂේත්‍රවල හා දිස්ත්‍රික්කයේ අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා SDG ඉලක්කයන් මත ප්‍රතිපාදන ප්‍රතිශත නිකුත් කළ යුතුය.

06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

06.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / (අතිරික්ත)**
ජ්‍යෙෂ්ඨ	13	12	1
තෘතීයික	4	3	1
ද්විතියික	80	76	4
ප්‍රාථමික	39	30	9
එකතුව	136	121	15

06.2 **ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපෑම

බහු කාර්ය සංවර්ධන සහායකයින් හා සේවා පුහුණු ලාභීන් මගින් ද්විතියික හා ප්‍රාථමික නිලධාරීන්ගේ කාර්යයන් සිදුකර ගැනීම මගින් ආයතනයේ කාර්ය සාධනය පවත්වා ගැනීම කටයුතු කර ඇත.

06.3 මානව සම්පත් සංවර්ධනය

අනු අංකය	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (Rs'000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ලබා ගත් දැනුම*
				දේශීය	විදේශීය		
1.	ග්‍රාම නිළධාරී පුහුණුව	417	2021.12.04 - 2021.12.10	339,800.00	-	දේශීයව	හොඳයි
2.	ග්‍රාම නිළධාරී දින 03ක පුහුණුව	417	2021.12.22 - 2021.12.30	525,000.00	-	දේශීයව	හොඳයි
3.	ITMIS ගිණුම් පුහුණුව	150	2021.11.30 - 2021.12.01	323,662.00	-	දේශීයව	හොඳයි
4.	කළමනාකරණ සේවා නිළධාරී සේවයේ I ශ්‍රේණියේ නිළධාරින්ගේ කාර්යක්ෂමතා කඩඉම සඳහා නිර්දේශිත පුහුණු පාඨමාලාව (සිංහල මාධ්‍ය)	29	2021.12.13 - 2021.12.22	145,890.00	-	දේශීයව	ඉතා හොඳයි
5.	කළමනාකරණ සේවා නිළධාරී සේවයේ I ශ්‍රේණියේ නිළධාරින්ගේ කාර්යක්ෂමතා කඩඉම සඳහා නිර්දේශිත පුහුණු පාඨමාලාව (දෙමළ මාධ්‍ය)	23	2021.12.16 - 2021.12.28	108,990.00	-	දේශීයව	ඉතා හොඳයි

07. **පරිච්ඡේදය – අනුකූලතා වාර්තාව**

ඡංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ.		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ.		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	-		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	-		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	-		
1.6	වෙනත්	-		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.8	තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			

3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	අනුකූල වේ.		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ.		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ.		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ.		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ.		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ.		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		

7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	75%	25% (කොවිඩ් - 19)	විකල්ප ක්‍රියාමාර්ග අනුගමනය කරනු ලැබේ.(සමාජ මාධ්‍ය මඟින්)
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම	අනුකූල වේ.		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ.		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ.		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අනුකූල වේ		

10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ.		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නෙඉක්මවන පරිදි බැරකම්වලට ඵලඹීම	අනුකූල වේ.		
12	**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්ට වලට අනුකූල වීම.	අනුකූල වේ.		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ.		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම.	අනුකූල වේ.		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ.		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ.		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ.		
15	**ආදායම් ගිණුම**			

15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ.		
15.2	රැස් කර තිබූ ආදයම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ.		
15.3	මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම			
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම	අනුකූල වේ.		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**	අනුකූල වේ		

19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල නොවේ	Covid 19 වසංගත තත්වය හේතුවෙන් මෙය සිදු නොකරන ලදි.	ඉදිරියේදී කටයුතු කරමි.
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ.		

අවසානය.